CHATHURA DRIVING SCHOOL

# චතුර

## රියදුරු පුහුණු පාසල
## බෙලිඅත්ත

0777 60 15 62







# මාර්ග උපදේශ අත්වැල.

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017



# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## අනතුරු හැඟවීමේ සංඥා

**මෙම මාර්ග සංඥා වලට 20m- 50m ඉදිරියෙන් අදාල ස්ථානය ඇති බව දැක්වේ.**

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 1 | වම් පැත්තට වංගුව ඉදිරියෙනි |  | මාර්ගයේ වමට තියුණු වංගුව ඇති ස්ථානයක් ඉදිරියෙනි |
| 2 | දකුණු පැත්තට වංගුව ඉදිරියෙනි |  | මාර්ගයේ දකුණට තියුණු වංගුවක් ඇති ස්ථානයක් ඉදිරියෙනි |
| 3 | වම් පැත්තට ද්විත්ව වංගුවක් ඉදිරියෙනි |  | මාර්ගයක වංගු දෙකක් එකිනෙකට ඉතා සමීපයෙන් පළමුවැන්න වම් පැත්තට ද දෙවැන්න දකුණු පැත්තට පිහිටි ස්ථානයක් |
| 4 | දකුණ පැත්තට දිවිත්ව වංගුව ඉදිරියෙනි |  | මාර්ගයේ වංගු දෙකක් එකිනෙකට ඉතා සමීපයෙන් පළමුවැන්න දකුණු පැත්තට ද දෙවැන්න වම් පැත්තට ද පිහිටි ස්ථානයක් ඉදිරියෙනි. |
| 5 | දකුණු පැත්තට වැලමිට වංගුව ඉදිරියෙනි |  | මාර්ගයේ දකුණු පැත්තට ඉතා තියුණු වැලමිට වංගුවක් පිහිටි ස්ථානයක් ඉදිරියෙනි |
| 6 | වම් පැත්තට වැලමිට වංගුව ඉදිරියෙනි |  | මාර්ගයේ වම් පැත්තට ඉතා තියුණු වැලමිට වංගුවක් පිහිටි ස්ථානයක් ඉදිරියෙනි |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 7 | ද්විත්ව රථ මාර්ගය අවසානය ඉදිරියෙනි |  | මාර්ගයක ද්විත්ව රථ මාර්ගයේ අවසානය ඉදිරියෙනි |
| 7 | ද්විත්ව රථ මාර්ගය ආරම්භය ඉදිරියෙනි |  | මාර්ගයක ද්විත්ව රථ මාර්ගයේ ආරම්භ ස්ථානය ඉදිරියෙනි |
| 8 | ඉදිරියේ දී මාර්ගය පටුය |  | මාර්ගයේ පටුව පිහිටි ස්ථානයක් ඉදිරියෙනි |
| | මාර්ගයේ වම්පස පටු වීම ඉදිරියෙනි |  | මාර්ගයේ වම්පස පටු ස්ථානයක් ඉදිරියෙනි |
| | මාර්ගයේ දකුණුපස පටු වීම ඉදිරියෙනි |  | මාර්ගයේ දකුණුපස පටු ස්ථානයක් ඉදිරියෙනි |
| 9 | එකිනෙක හරහා ගමන් කරන මාර්ගය ඉදිරියෙනි |  | එකිනෙක ඡේදනය වී බෙදී යන සේ මාර්ගයන් දෙකකින් යුත් මංසන්ධියක් ඉදිරියෙනි |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

**0742692585 / 0716920017**

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| i 10 | පළවැනි පැති මාර්ගය වම් පැත්තට විහිදෙන විසම සන්ධිය ඉදිරියෙනි |  | පැති මාර්ගයන් දෙකක් එකිනෙකට ආසන්නව පළමුවැන්න වම් පැත්තට ද, දෙවැන්න දකුණු පැත්තට ද ප්‍රධාන මාර්ගය ඡේදනය වන ප්‍රධාන මාර්ගයේ පිහිටි විසම සන්ධියක් සහිත ස්ථානයක් |
| i 11 | පළමුවැනි පැති මාර්ගය දකුණු පැත්තට විහිදෙන විසම සන්ධිය ඉදිරියෙනි |  | පැති මාර්ගයන් දෙකක් එකිනෙකට ආසන්නව පළමුවැන්න දකුණු පැත්තට ද දෙවැන්න වම් පැත්තට ද ප්‍රධාන මාර්ගය ඡේදනය වන සේ ප්‍රධාන මාර්ගයේ පිහිටි විසම සන්ධියක් සහිත ස්ථානයක් |
| i 12 | T හැඩයේ මං සන්ධිය ඉදිරියෙනි |  | ටී අකුරක හැඩයේ ඇති මං සන්ධියක් සෑදෙන සේ මාර්ගයක් තවත් මාර්ගයකට සම්බන්ධ වන ස්ථානයක් ඉදිරියෙනි |
| i 13 | Y හැඩයේ මං සන්ධිය ඉදිරියෙනි |  | මාර්ග තුනක් පොදු ස්ථානයක දී හමු වන සන්ධි ස්ථානයක් ඉදිරියෙනි |
| i 14 | වම් පැත්තෙන් රථවාහන ප්‍රධාන මාර්ගයට එක්වන සන්ධිය ඉදිරියෙනි |  | වම් පැත්තෙන් එන පැති මාර්ගයක් ප්‍රධාන මාර්ගය හා එක් වන සන්ධියකි |
| i | වම් පැත්තෙන් රථ වාහන ප්‍රධාන මාර්ගයට සෘජුකෝණාකාරව එක්වන සන්ධිය ඉදිරියෙනි |  | වම්පැත්තෙන් එන පැති මාර්ගයක් ප්‍රධාන මාර්ග හා සෘජුකෝණාකාරව එක් වන සන්ධියක් ඉදිරියෙන් |

චතුර රියදුරු පුහුණු පාසල බෙලිඅත්ත

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 15 | දකුණු පැත්තෙන් රථවාහන ප්‍රධාන මාර්ගයට එක්වන සන්ධියක් ඉදිරියෙනි |  | දකුණු පැත්තෙන් එන පැති මාර්ගය ප්‍රධාන මාර්ගය හා එක්වන සන්ධියක් ඉදිරියෙන් |
| | දකුණු පැත්තෙන් රථවාහන ප්‍රධාන මාර්ගයට සෘජුකෝණාකාරව එක්වන සන්ධිය ඉදිරියෙනි |  | දකුණු පැත්තෙන් එන පැති මාර්ගය ප්‍රධාන මාර්ගය හා සෘජුකෝණාකාරව එක්වන සන්ධිය ඉදිරියෙන් |
| 16 | පටු පාලම ඉදිරියෙනි |  | පටු පාලමක් ඉදිරියෙනි |
| | රථවාහන දෙපසට ගමන් කිරීම ඉදිරියෙනි |  | තාවකාලිකව හෝ ස්ථිර ලෙස එම රථ මාර්ගයේම රථවාහන දෙපසට ගමන් කිරීම සඳහා වූ මාර්ගයේ කොටසක් ඉදිරියෙනි |
| 17 | ඉදිරියෙන් නවතිනු |  | 10 වන නියෝගය අනුව ප්‍රධාන මාර්ගය ඡේදනයවීමට හෝ හමුවීමට පෙර ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථ වාහනවලට පුමුඛත්වයදීමට අතුරු මාර්ගයේ ගමන් කරන රථවාහන නැවැත්විය යුතු ස්ථානය ඉදිරියෙනි |
| 18 | ඉදිරියෙන් මාර්ගය ඉඩ දෙනු |  | 10 වන නියෝගය අනුව මාර්ගය ඡේදනයවීමට හෝ හමුවන සන්ධියට ඇතුලුවීමට පෙර ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථ වාහන සඳහා සුලු මාර්ගයේ ගමන් කරන රථවාහන විසින් ඉඩදිය යුතු ස්ථානය ඉදිරියෙනි |
| 19 | වටරවුම ඉදිරියෙනි |  | මාර්ගයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකිනෙක ඡේදනය කරන මධ්‍යයේ වෘත්තාකාර මධ්‍ය දූපතක් සහිත එම දූපත වටා දක්ෂිණාවර්ත දිශාවට රථ වාහන ගමන් කළ යුතු වන සේ පිහිටි වටරවුමක් වශයෙන් හඳුන්වනු ලබන ස්ථානයක් |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 20 | රථ වාහන ආලෝක සංඥා ඉදිරියෙන් |  | රථ වාහන ආලෝක සංඥා මගින් පාලනය කරනු ලබන මාර්ගයන් ඡේදනය වන ස්ථානයක් |
| 21 | අන්තරාදායක බෑවුම ඉදිරියෙනි |  | මාර්ගයේ පහතට තියුණු බෑවුම සහිත කොටසක් |
| 22 | අන්තරාදායක නැගුම ඉදිරියෙනි |  | මාගීයේ ඉහළට තියුණු නැගීමක් සහිත මාගීයේ කොටසක් ඉදිරියෙන් |
| 23 | ලිස්සන සුළු මාගීය ඉදිරියෙනි |  | මාර්ගයේ ලිස්සන සුලු හෝ ලිස්සා යාමට හැකි ස්ථානයක් හෝ කොටසක් ඉදිරියෙනි |
| ) | බුරුල් කළුගල් කැබලි/බොරළු ඉදිරියෙනි |  | කළුගල්, බොරළු ආදිය සමන්විත රථ මාගීයේ කොටස ඉදිරියෙනි |
| 24 | ගල් පර්වත කැබලි වැටෙන ස්ථානය ඉදිරියෙනි |  | මාර්ගයේ කොටසක රථවාහන පථය මතුපිටට ගල් පර්වත වැටීමේ අවදානම සහිත හෝ රථ වාහන මාර්ගය මතුපිට වැටුනු ගල් පර්වත සහිත ස්ථානයක් හෝ කොටසක් ඉදිරියෙනි |
| ද 25 | පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙන් |  | මාර්ගයේ රථවාහන පථය හරහා පදිකයන් මාරුවන ස්ථානයක් ඉදිරියෙනි |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 26 | ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි |  | මාර්ගය අසළ පාසැලක් හෝ ක්‍රීඩා පිටියක් පිහිටා ඇති ළමයින් නිතර මාර්ගය හරහා ගමන් කරන ස්ථානයක් ඉදිරියෙන් |
| | අන්ධ පුද්ගලයින් මාරු වන ස්ථානය ඉදිරියෙනි |  | මාර්ගයේ රථවාහන පථය හරහා අන්ධ පුද්ගලයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි |
| 27 | මිනිසුන් වැඩෙහි යෙදෙන ස්ථානය ඉදිරියෙනි |  | මාර්ගයේ ධාවන පථය මත මිනිසුන් වැඩ කරමින් සිටින මාර්ගයේ වැඩ කෙරෙමින් පවත්නා ස්ථානයක් |
| 28 | ගේට්ටු සහිත දුම්රිය හරස් මාගීය ඉදිරියෙනි |  | ගේට්ටු මගින් ආරක්ෂිත දුම්රිය හරස් මාගීයක් ඉදිරියෙනි |
| 29 7 | අනාරක්ෂිත දුම්රිය හරස් මාගීය ඉදිරියෙනි |  | අනාරක්ෂිත දුම්රිය හරස් මාගීය ඉදිරියෙනි |
| 30 | බස්රථ ධාවන තිරුව ඉදිරියෙන් |  | මාර්ගයක බස්රථ වල ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද රථ ධාවන තිරුව ආරම්භ වන ස්ථානයක් |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 31 | පාපැදි ධාවන තිරුව ඉදිරියෙනි |  | මාර්ගයක පාපැදි වල ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද ධාවන තිරුවක් ආරම්භ වන ස්ථානයක් |
| 32 | පාපැදිකරුවන් මාරුවන ස්ථානය ඉදිරියෙනි |  | පාපැදිකරුවන් මාර්ගයට ඇතුළුවන හෝ ඒ හරහා ගමන් කරන ස්ථානය ඉදිරියෙන් |
| 33 | ගවයන් හෝ වෙනත් සතුන් මාර්ගය හරහා ගමන් කිරීමට ඉඩ ඇති ස්ථානයක් ඉදිරියෙන් |  | ගවයන් හෝ වෙනත් සතුන් මාර්ගය හරහා ගමන් කරන හෝ මාර්ගයෙහි සිටිනු දැකිය හැකි ස්ථානයක් ඉදිරියෙන් |
| 34 | මාර්ගය පැත්තකින් පිහිටි ජලාශයකට බෑවුම් වන ස්ථානය ඉදිරියෙනි |  | මාර්ගය කොටු මළුවක් මත හෝ මාර්ගයේ පැත්තක් තියුණු ලෙස ගඟකට හෝ විලකට හෝ ජල මාර්ගයකට හෝ මුහුදට බෑවුම්වන හෝ වැටෙන සේ පිහිටි ස්ථානය ඉදිරියෙනි |
| | අන්තරාදායක බෑවුම් සහිත පැත්ත ඉදිරියෙන් |  | පැත්තක අන්තරාදායක ගැඹුරු බෑවුමක් ඇති පටු මාර්ග කොටසක් ඉදිරියෙන් |
| | වේග බාධක උස් තීරුව |  | ධාවන වේගය සීමා කෙරෙන මාර්ගයේ වැටියොදා ඇති පෙදෙස ඉදිරියෙන් |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| | අසමාන මාර්ග ඉදිරියෙනි |  | අන්තරාදායක ලෙස අසමාන වන රිය මාර්ග දැක්වෙන පෙදෙස ඉදිරියෙනි |
| | ගිලුම හෝ දියමංකඩ ඉදිරියෙනි |  | ගිලුනු මාර්ගය හෝ දියමංකඩ ඉදිරියෙනි |
| | උස්වැටි පාලම ඉදිරියෙනි |  | උස්වැටි පාලම සහිත ස්ථානය ඉදිරියෙනි |
| | උමග ඉදිරියෙනි |  | මාගීයේ උමග ඇති ස්ථානය ඉදිරියෙනි |
| | පහලින් පියාසර කරන ගුවන්යානා ඉදිරියෙනි |  | පහලින් පියාසර කරන ගුවන් යානා ඇති ස්ථානය ඉදිරියෙනි |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 2. පාලන සංඥා

සියලුම පරිමාණයන් මිලි මීටර් වලිනි

### 2. (අ) තහනම් සංඥා

අංක 35 සිට 48 දක්වා වන තහනම් පාලන සංඥා කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 35 | ඇතුල්වීම තහනම | <br> | රථවාහන ඇතුලු නොවිය යුතුයි<br>**තහනම්.** |
| 36 | වම් පැත්තට හැරවීම තහනම |  | රථ වාහන වම් පැත්තට නොහැරවිය යුතුයි<br>**තහනම්.** |
| 37 | දකුණු පැත්තට හැරවීම තහනම | Your paragraph text<br> | රථ වාහන දකුණු පැත්තට නොහැරවිය යුතුයි<br>**තහනම්.** |
| 38 | U හැඩයට සිටින සේ හැරවීම තහනම් |  | රථවාහන වලට U හැඩයට ආපස්සට හැරවීම තහනම්ය<br>**තහනම්.** |
| 39 | වාහන ඉස්සර කිරීම තහනම<br> |  | බලශක්තියෙන් ධාවනය කරනු ලබන වාහන, රෝද දෙකේ සැහැල්ලු යතුරුපැදි, පැති කාර් රහිත රෝද දෙකේ යතුරු පැදි හැර වෙනත් වාහන ඉස්සර කිරීම තහනම්<br>**තහනම්.** |
| | වාහන ඉස්සර කිරීමේ තහනමේ නිමාව | <br> | පි.එච්.එස්.05 හි දැක්වෙන වාහන ඉස්සර කිරීම තහනම නිමාව |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 2. පාලන සංඥා

### 2. (අ) තහනම් සංඥා

අංක 35 සිට 48 දක්වා වන තහනම් පාලන සංඥා කඩ කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි.

| | | | |
|---|---|---|---|
| | බඩු පැටවූ වාහන ඉස්සර කිරීම තහනම් |  | බලශක්තියෙන් ධාවනය කරනු ලබන වාහන, රෝද දෙකේ සැහැල්ලු යතුරුපැදි, පැති කාර් රහිත රෝද දෙකේ යතුරු පැදි හැර වෙනත් වාහන ටොන් 3.5 ට වැඩි බඩු පැට වූ වාහන මගින් ඉස්සර කිරීම තහනම්ය **තහනම්.** |
| | බඩු පැටවූ වාහන ඉස්සර කිරීමේ තහනමේ නිමාව |  | පි.එච්.එස්.07 හි දැක්වෙන වාහන ඉස්සර කිරීම තහනම නිමාව |
| 40 | නලා ශබ්ද කිරීම තහනම් |  | යම් ස්ථානයක දී හෝ මාර්ගයක කොටසක ශබ්ද සංඥා පාවිච්චි කිරීම තහනම්ය **තහනම්.** |
| 41 | සියලුම රථවාහන සඳහා මාගීය වසා ඇත |  | සියලුම රථවාහන නිශ්චිත මාර්ගයකට හෝ මාගීයේ කොටසකට ඇතුළුවීම තහනම්ය **තහනම්.** |
| 44 | මෝටර් රථ සඳහා මාගීය වසා ඇත |  | මෝටර් රථවලට මාගීයේ කොටසකට හෝ මාගීයට ඇතුළුවීම තහනම්ය **තහනම්.** |
| 42 | බස් රථ සඳහා මාගීය වසා ඇත |  | බස් රථවලට මාගීයේ කොටසකට හෝ මාගීයට ඇතුළුවීම තහනම්ය **තහනම්.** |
| 43 | ලොරි සඳහා මාගීය වසා ඇත |  | ලොරිවලට මාගීයේ කොටසකට හෝ මාගීයට ඇතුළුවීම තහනම්ය **තහනම්.** |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 2. පාලන සංඥා

### 2. (අ) තහනම් සංඥා

| | නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| | ඇමුණු වාහන සඳහා මාර්ගය වසා ඇත |  | ඇමුණු වාහන මාර්ගයේ කොටසකට හෝ මාර්ගයට ඇතුළුවීම තහනම්ය **තහනම්.** |
| | බලශක්තියෙන් ධාවනය කරනු ලබන කෘෂිකාර්මික වාහන සඳහා මාර්ගය වසා ඇත |  | බලශක්තියෙන් ධාවනය කරනු ලබන කෘෂිකාර්මික වාහන සඳහා මාර්ගයට හෝ මාර්ගයේ කොටසකට හෝ ඇතුල්වීම තහනම්ය **තහනම්.** |
| | අත්ට්‍රැක්ටර් සඳහා මාර්ගය වසා ඇත |  | අත්ට්‍රැක්ටර් මාර්ගයට හෝ මාර්ගයේ කොටසකට ඇතුල්වීම තහනම්ය **තහනම්.** |
| | ත්‍රිරෝද රථ සඳහා මාර්ගය වසා ඇත |  | ත්‍රිරෝද රථ සඳහා මාර්ගයකට හෝ මාර්ග කොටසකට ඇතුල්වීම තහනම්ය **තහනම්.** |
| | යතුරු පැදි සඳහා මාර්ගය වසා ඇත |  | යතුරු පැදි මාර්ගයට හෝ මාර්ග කොටසකට ඇතුල්වීම තහනම්ය **තහනම්.** |
| | පා පැදි සඳහා මාර්ගය වසා ඇත |  | පා පැදිකරුවන් මාර්ගයකට හෝ මාර්ග කොටසකට ඇතුල්වීම තහනම්ය **තහනම්.** |
| | සතුන් ඇද ගෙන යනු ලබන වාහන සඳහා මාර්ගය වසා ඇත. |  | සතුන් ඇද ගෙන යනු ලබන වාහන මාර්ගයට හෝ මාර්ගයේ කොටසකට ඇතුල්වීම තහනම්ය **තහනම්.** |

අංක 35 සිට 48 දක්වා වන තහනම් පාලන සංඥා කඩ කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි.

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

**0742692585 / 0716920017**

## 2. පාලන සංඥා

2. (අ) තහනම් සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| | අත් කරත්ත සඳහා මාර්ගය වසා ඇත |  | **තහනම්.** අත් කරත්තවලට මාර්ගයට හෝ මාර්ගයේ කොටසකට ඇතුල්වීම තහනම්ය |
| | පදිකයන් සඳහා මාර්ගය වසා ඇත |  | **තහනම්.** පදිකයන්ට මාර්ගයට හෝ මාර්ග කොටසකට ඇතුල්වීම තහනම්ය |
| 45 | රථවාහන නැවැත්වීම තහනම් |  | **තහනම්.** මාර්ගයේ සලකුණ පිහිටුවා ඇති පැත්තේ රථවාහන නවතා තැබීම තහනම්ය<br>මෙහි වාහන නතර කල හැකි අතර රියදුරු අසුනේ සිටිය යුතුය. සාධාරණ කාලයක් තුල තැනැත්තකු වාහනයට නැගීම , බැසීම, බඩුබාහිරාදිය බෑම , පැටවීම කල හැකිය. |
| 46 | රථවාහන නැවැත්වීම සහ පැටවීම තහනම් |  | **තහනම්.** මාර්ගයේ සලකුණු පිහිටුවා ඇති පැත්තේ වාහන නැවැත්වීම හෝ නවත්වා තබා ගැනීම තහනම්ය |
| 47 | ඔත්තේ දිනවල වාහන නැවැත්වීම තහනම් |  | **තහනම්.** ඔත්තේ දිනවල (මාසයේ 1,3,5,7,9,11,13,15,17,19,21,23,25,27,29,31) සලකුණ පිහිටුවා ඇති පැත්තේ රථ වාහන නැවැත්වීම තහනම්ය |
| 48 | ඉරට්ටේ දිනවල වාහන නැවැත්වීම තහනම් |  | **තහනම්.** ඉරට්ටේ දිනවල (මාසයේ 2,4,6,8, 10,12,14,16,18,20,22,24,26,28,30) රථ වාහන සලකුණ පිහිටුවා ඇති පැත්තේ නැවැත්වීම තහනම්ය |

අංක 35 සිට 48 දක්වා වන තහනම් පාලන සංඥා කඩ කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි.

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

CHATHURA Driving School BELIATTA

# 2. පාලන සංඥා

## 2 (ආ) අතිරේක පුවරු

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 49 | නියමයට ඇති දුර |  | සලකුණේ සිට නියමය ආරම්භ කරන ස්ථානයට ඇති දුර දැක්වීමට පුවරුව |
| 50 | නියමය සහිත සලකුණේ දිග ප්‍රමාණය |  | නියාමන සලකුණකින් නියමයේ ඇති දිග ප්‍රමාණය දැක්වෙන පුවරුව |
| 51 | වාහන නවතා තැබීමේ සහ නැවැත්වීමේ නියමය ආරම්භය |  | වාහන නවතා තැබීමේ හා නැවැත්වීමේ තහනම් නියමය ආරම්භය දැක්වෙන පුවරුව |
| 52 | වාහන නවතා තැබීමේ සහ නැවැත්වීමේ තහනම් නියමයේ දිශාව |  | වාහන නවතා තැබීමේ හා නැවැත්වීමේ නියමය දිගටම පැවැත්වෙන බැව් දැක්වීමට භාවිතා කරන පුවරුව |
| 53 | වාහන නවතා තැබීමේ සහ නැවැත්වීමේ තහනම් නියමය අවසානය |  | වාහන නවතා තැබීමේ හෝ නැවැත්වීමේ තහනම් නියමය අවසන් කෙරෙන බවට දැන්වීමට භාවිතා කරන පුවරුව |
| | වාහන නවතා තැබීමේ සහ නැවැත්වීමේ තහනම් කෙරෙන කාලසීමාව සහ දිශාව |  | වාහන නවතා තැබීමේ සහ නැවැත්වීමේ තහනම් වන කාලසීමාව හා ඒවා බලපාන දිශාව සම්බන්ධයෙන් භාවිත කරන පුවරුව |

තහනම කොතෙක් දුරට පවතීද යන්නයි.තහනම් සලකුණක් සමග මෙම අතිරේක සලකුණු දක්වයි.

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

CHATHURA Driving School BELIATTA

## 2. පාලන සංඥා

### 2 (ආ) අතිරේක පුවරු

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| | ආර්.එස්.එස් - 09 සලකුණට නියමයන් නිදහස් කරන බැව් සලකුණේ සවි කළ යුතුය |  | තහනම නිදහස් කළ බවට තහනම් සලකුණට සවි කළ පුවරුවේ වගන්ති තහනම නිදහස් කිරීමේ පදනම මත වෙනස් වේ |
| | පාසැල් හා වෙනත් නියම කරන ස්ථාන (අතිරේක සලකුණ) වෙනුවට ආර්.එස්.එස්. - 09 සලකුණට ඇතුළත් කළ යුතු ය |  | වේග සීමාවන් හෝ නලා ශබ්ද කිරීමේ නියමයන් අදාළ නියම කරනු ලබන ස්ථානය අනුව ආර්.එස්.එස්. - 09 දරන නියාමන සලකුණට සවි කරන ලද පුවරුව |
| | ආර්.එස්.එස්. -05 දරන වේග සීමා සලකුණට සවි කළ යුතු ය |  | වාහනවල වර්ග දැන්වීමට ආර්. එස්. එස්. - 05 සලකුණේ සවි කල පුවරුව |
| | ආර්.එස්.එස් 06 දරන වේග සීමා සලකුණට සවි කළ යුතු ය |  | වාහන වර්ග දැක්වීමට ආර්.එස්.එස්. - 06 සලකුණේ සවි කල පුවරුව |
| | ආර්.එස්.එස් 07 දරන වේග සීමා සලකුණට සවි කළ යුතු ය |  | වාහන වර්ග දැක්වීමට ආර්.එස්.එස්. - 07 සලකුණේ සවි කළ පුවරුව |

තහනම කොතෙක් දුරට පවතීද යන්නයි.තහනම් සලකුණක් සමග මෙම අතිරේක සලකුණු දක්වයි.

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 2. පාලන සංඥා

### 2 (ආ) අතිරේක පුවරු

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| | ආර්.එස්.එස් 08 දරන වේග සීමා සලකුණේ සවි කළ යුතු ය |  | වාහන වර්ග දැක්වීමට ආර්.එස්.එස්. - 08 සලකුණට සවි කළ පුවරුව |
| | ආර්.එස්.එස් - 05 සහ ඒ.පී.ආර්-09 වේග සීමා සලකුණු අතරට සවි කළ යුතු ය |   | ආර්. එස්. එස්. - 05 සහ ඒ. පී. ආර්. 09 වේග සීමා සලකුණු අතර සවි කළ පුවරුව |
| | සලකුණු පී.එච්.එස් -01, 02 හෝ 03 ට අධිවේගී මාර්ගයට ප්‍රවේශ වන ස්ථානයේ සවි කළ යුතුය |   | අධිවේගී මාර්ගයට ඇතුල් වන ස්ථානයේ පී.එච්.එස්.-01, 02 හෝ 03 සලකුණුවලට සවි කළ පුවරුව |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

තහනම කොතෙක් දුරට පවතීද යන්නයි.තහනම් සලකුණක් සමග මෙම අතිරේක සලකුණු දක්වයි.

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 2. පාලන සංඥා

### 2 (ඇ) සීමාකාරී සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 54 | පළල් සීමාව |  | දක්වා ඇති පළල ප්‍රමාණය ඉක්මවන පළලින් යුත් වාහන හෝ බඩු පටවන ලද වාහන ගමන් කිරීම තහනම්ය |
| 55 | උස සීමාව |  | දක්වා ඇති උස ප්‍රමාණය ඉක්මවා සම්පූර්ණ උසින් යුත් වාහන හෝ බඩු පටවන ලද වාහන ගමන් කිරීම තහනම්ය |
| 56 | බර සීමාව |  | දක්වා ඇති බර ප්‍රමාණය ඉක්මවන බරින් යුත් වාහන හෝ බඩු පටවන ලද වාහන ගමන් කිරීම තහනම්ය |
| 57 | ඇක්සලයක් මත නියමිත බර සීමාව |  | දක්වා ඇති ඇක්සල බර ප්‍රමාණය ඉක්මවන බරින් යුත් වාහන හෝ බඩු පටවන ලද වාහන ගමන් කිරීම තහනම්ය |
| 58 | සංවර්ධිත පෙදෙස්වල ත්‍රිරෝද රථ සහ ඉඩම් වාහන හැර රථ වාහන |  | ත්‍රීවිලර්, ට්‍රැක්ටර් හැර, මෝටර් කාර් ද්වි කාර්යය වාහන, යතුරු පැදි, මෝටර් කෝච්, මෝටර් ලොරි යන වාහන සංවර්ධිත ප්‍රදේශ හා කඳු ප්‍රදේශවල දක්වා ඇති පැ.කි.මී 50 වේග සීමා ඉක්මවා පැදවීම තහනම්ය |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# 2. පාලන සංඥා

## 2 (ඇ ) සීමාකාරී සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| | සංවර්ධිත පෙදෙස්වලට බාහිරව ඇති ප්‍රදේශ සඳහා සැහැල්ලු වාහනවලට ඇති වේග සීමා |  | මෝටර් කාර්, ද්වි කාර්යය වාහන සහ යතුරු පැදි අසංවර්ධිත ප්‍රදේශවල දක්වා ඇති පැ.කි.මී 70 වේග සීමා ඉක්මවා පැදවීම තහනම්ය |
| | අසංවර්ධිත ප්‍රදේශ සඳහා බර වාහන වේග සීමා |  | මෝටර් කෝච්, මෝටර් ලොරි, අසංවර්ධිත ප්‍රදේශවලට අදාළව දක්වා ඇති වේග සීමා ඉක්මවා ධාවනය කිරීම තහනම්ය. |
| | ත්‍රීවිලර්, ඉඩම් වාහන ආදිය සඳහා සංවර්ධිත හා අසංවර්ධිත ප්‍රදේශවල වේග සීමා |  | මෝටර් ත්‍රිසිකල්, වෑන්, මෝටර් ත්‍රිසිකල් ඉඩම් වාහන, වාෂ්ප බලයෙන් ධාවනය වන රථ වාහන කාණ්ඩ අසංවර්ධිත ප්‍රදේශ සහ සංවර්ධිත ප්‍රදේශ සඳහා දක්වා ඇති වේග සීමා ඉක්මවා ධාවනය කිරීම තහනම්ය. |
| | පාසැල් හා රෝහල් හෝ වෙනත් නියම කරන ස්ථාන සඳහා සියළුම රථ වාහන වේග සීමා |  | පාසැල් හා රෝහල් හෝ වෙනත් නියම කරන ස්ථාන දක්වා ඇති වේග සීමා ඉක්මවා ධාවනය කිරීම සියළුම වර්ගවල වාහනවලට තහනම්ය.<br>අංක සහ සලකුණු සීමා කර ඇති වේග සීමා අනුව වෙනස් විය යුතුය. |
| 59 | වේග සීමාවෙහි අවසානය |  | පී.එච්.එස් - 05 සලකුණෙහි දැක්වෙන වේග සීමාව අවසන් ය. අංක සහ සලකුණු සීමා කර ඇති වේග සීමාව අනුව වෙනස් විය හැකිය. |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 2. පාලන සංඥා

### 2 (ඈ ) විධාන සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 60 | වම් පැත්තට හැරවිය යුතුය |  | රථවාහන වම් පැත්තට හැරවිය යුතුය |
| 61 | දකුණු පැත්තට හැරවිය යුතුය |  | රථවාහන දකුණු පැත්තට හැරවිය යුතුය |
| 62 | කෙළින්ම ඉදිරියට ගමන් කළ යුතුය |  | රථවාහන කෙළින්ම ඉදිරිපසට ධාවනය කළ යුතු ය |
| 63 | ඉදිරියෙන් වම් පැත්තට හැරවිය යුතු ය |  | රථවාහන ඉදිරියෙන් වම් පැත්තට හැරවිය යුතු ය |
| 64 | ඉදිරියෙන් දකුණු පැත්තට හැරවිය යුතු ය |  | රථවාහන ඉදිරියෙන් දකුණු පැත්තට හැරවිය යුතු ය |
| 65 | වම් පැත්තෙන් පසු කරන්න |  | සලකුණ පසු කරන වාහන සලකුණට වම් පැත්තෙන් ගමන් කළ යුතු යි |
| | දකුණු පැත්තෙන් පසු කරන්න |  | සලකුණ පසු කරන වාහන සලකුණට දකුණු පැත්තෙන් ගමන් කළ යුතු යි |

මෙම සංඥා වලට අනිවාර්යයෙන්ම අනුගත වී ගමන් කලයුතුය.

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

## 2. පාලන සංඥා

### 2 (ඈ ) විධාන සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| | අවශ්‍ය පැත්තෙන් පසු කරන්න |  | සලකුණ පසු කරන වාහන සලකුණට දකුණු පැත්තෙන් හෝ වම් පැත්තෙන් ගමන් කළ යුතුය |
| 66 | අනිවාර්ය වටරවුම |  | මාර්ගයක මංසන්ධි ස්ථානයකට ඇතුලු වන වාහන විසින් රථ ධාවන පථයේ පිහිටුවා ඇති ආර්.එම්- 02 හි 05 වන උපලේඛනයේ දැක්වෙන සලකුණෙහි දකුණු පැත්තේ සිට එන රථ වාහන වලට ප්‍රමුඛත්වය දිය යුතුය. නැතහොත් මංසන්ධි ස්ථානයේ මාර්ග ලකුණු කිරීම දෘෂ්‍යමාන නොවේ නම් දක්ෂිණාවෘතව ඊතල මගින් පෙන්වා ඇති දිශාවට අනුව එම වාහන එම ස්ථානය පසුකර ඉදිරියට ගමන් කළ යුතුය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

**මෙම සංඥා වලට අනිවාර්යයෙන්ම අනුගත වී ගමන් කලයුතුය.**

## 2. පාලන සංඥා

### 2 (ඉ ) ප්‍රමුඛතා සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 67 | මාර්ගය ඉඩ දෙනු |  | 10 වන නියෝගයේ (2) ඡේදයේ දැක්වෙන නියමයන්ට අනුව සුළු මාර්ගයක් විසින් ප්‍රධාන මාර්ගයක් ඡේදනය වන ස්ථානයක දී එකී සුළු මාර්ගයේ ගමන් කරන රථ වාහන විසින් ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථ වාහන වලට ඉඩදිය යුතු බවට එසේ සුළු මාර්ගයේ ගමන් කරන රථ වාහන වලට දැන්වීමයි |
| 68 | නවතිනු |  | 10 වන නියෝගයේ (1) ඡේදයේ දැක්වෙන නියමයන්ට අනුව සුළු මාර්ගයක් විසින් ප්‍රධාන මාර්ගයක් ඡේදනය වන ස්ථානයකි. එකී සුලු මාර්ගයේ ගමන් කරන රථ වාහන නවත්වා ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථ වාහන වලට ප්‍රමුඛත්වය දිය යුතු බවට සුළු මාර්ගයේ ගමන් කරන රථ වාහන වලට දැන්වීමයි |
| 69 | දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි |  | මාර්ගයේ දුම්රිය හරස් මාර්ග ඇති ස්ථානය ඉදිරියෙන් |
| | දුම්රිය මාර්ග 2ක් හෝ වැඩි ගණනක් සහිත දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙනි |  | දුම්රිය මාර්ගයන් 2 ක් හෝ වැඩි ගණනක් සහිත දුම්රිය හරස් මාර්ගය ඇති පෙදෙසක් ඉදිරියෙනි |

ඉහත 67, 68, 69, 71 සංඥා දිස්වේ නම් අනෙක් පාර්ශවට අනිවාර්යයෙන්ම ප්‍රමුඛතාව ලබාදිය යුතුය.

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

CHATHURA Driving School BELIATTA

## 2. පාලන සංඥා

### 2 (ඉ) ප්‍රමුඛතා සංඥා

| | | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 70 | ප්‍රමුඛතා මාර්ගය |   **තමන්ට ගමන් කිරීමට ප්‍රමුඛතාව හිමිවේ.** | ප්‍රධාන මාර්ගයක් විසින් සුළු මාර්ගයක් ඡේදනය වී මං සන්ධියක් සෑදෙන ස්ථානයක දී ප්‍රධාන මාර්ගයට ඇතුලුවන සුළු මාර්ගයේ ගමන් කරන රථ වාහන විසින් ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථ වාහන වලට 10 වන නියෝගයේ (1) හෝ (2) ඡේදයට අනුව ප්‍රමුඛත්වය දිය යුතු බවට එකී ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථ වාහන වල රියැදුරන්ට දැන්වීම |
| 71 | ප්‍රමුඛතාව අවසන් |   | පී.ආර්.එස්. 03 සලකුණ මගින් දක්වන ලද පරිදි ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථ වාහන වලට ප්‍රමුඛත්වය දීම අවසන් වන බැව් ප්‍රධාන මාර්ගයේ ගමන් කරන රථ වාහන වල රියැදුරන් හට දැන්වීම |
| 72 | ඉදිරියෙන් යන වාහන වලට ප්‍රමුඛත්වය දිය යුතුය |   | මාර්ගය පටුව පවත්නා කොටසක් කරා ළඟා වන වාහන වල රියැදුරන් විසින් එකී පටු කොටස මත ඉදිරියට එන වාහන වලට ප්‍රමුඛත්වය දිය යුතු බව දැන්වීම |
| 73 | ඉදිරියට පැමිණෙන රථ වාහන වලට ප්‍රමුඛත්වය දිය යුතුය |   | **තමන්ට ගමන් කිරීමට ප්‍රමුඛතාව හිමිවේ.** මාර්ගයක පටුව පවත්නා කොටසකට විරුද්ධ දිශාවට ගමන් කරන වාහන වල රියැදුරන් එකී පටු කොටස මත වාහන වලට ප්‍රමුඛත්වය දිය යුතු බව මාර්ගයේ එම පටු කොටසට ළඟා වන රියැදුරන් හට දැන්වීම |

ඉහත 67, 68, 69, 71 සංඥා දිස්වේ නම් අනෙක් පාර්ශවට අනිවාර්යයෙන්ම ප්‍රමුඛතාව ලබාදිය යුතුය.

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

# 2. පාලන සංඥා

## 2 (ඊ) රියදුරන්ට ප්‍රයෝජනවත් අනිකුත් තොරතුරු සංඥා

| සලකුණු අංකය | සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 74 | පදිකයින් මාරු වන ස්ථානය |   | පදිකයින් මාර්ගය හරහා මාරුවන ස්ථානයක්. මාර්ගය හරහා ගමන් කරනු ලබන පදිකයන්ට රථ වාහන නවතා ඉඩ ලබා දිය යුතු ය. |
| 75 | තනි අතට ගමන් කරන මාර්ගය |   | තනි අතට ගමන් කරන මාර්ගය බව ස්ථිර කිරීම. ඊතලයේ දිශාවට රථ වාහන ගමන් කළ යුතු ය. |
| 76 | රෝහල |   | රෝහලක් ආසන්නයේ පිහිටා ඇති බව මාර්ගය පාවිච්චි කරන්නන්ට දැන්වීම. ඒ අනුව හදිසි අවශ්‍යතාවයක දී ප්‍රයෝජනය ලබාගැනීම සඳහා එය දවසේ පැය විසි හතර පුරා විවෘතව පැවතෙන බව හැඟවේ. |
| 77 | වාහන නවත්වන ස්ථානයක් |   | වාහන නවතා තැබීම සඳහා ඇති ස්ථානයක් |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# 2. පාලන සංඥා

## 2 (ඊ) රියදුරන්ට ප්‍රයෝජනවත් අනිකුත් තොරතුරු සංඥා

| සලකුණු අංකය | සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| | ආබාධිතයින් සඳහා වාහන නැවතුම |  | ආබාධිත තැනැත්තන් සඳහා වාහන නතර කිරීමට වෙන් කර ඇති ස්ථානයක්. වාහන නවතා තැබීම සඳහා වන ඕ. එස්. ඩී. - 04 සලකුණට අතිරේකව මෙම සලකුණ යෙදිය යුතුය. |
| 78 | බස්රථ නැවතුම |  | බස්රථ නැවතුමක් පිහිටි ස්ථානයක් |
| මෙම සංඥාවේ සිට මීටර් 15 ඉදිරියට හා පිටුපසටබස් රථ හැර වෙනත් වාහන නවතාලීම නොකල යුතුය. | | | |
| 79 | බස්රථ සඳහා පමණක් ඇති ධාවන තීරුව ආරම්භය හෝ ඉදිරියට පැතිරීම |  | බස්රථ සඳහා පමණක් වෙන් කර ඇති ධාවන තීරුවක් මාර්ගය පාවිච්චි කරන්නන්ට දැක්වීම. |
| 80 | බස්රථ සඳහා පමණක් වූ ධාවන තීරුව අවසානය |  | බස්රථ සඳහා පමණක් ඇති ධාවන තීරුවක් කෙළවර වන ස්ථානයක් |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# 2. පාලන සංඥා

## 2 (ඊ) රියදුරන්ට ප්‍රයෝජනවත් අනිකුත් තොරතුරු සංඥා

| | | | |
|---|---|---|---|
| 81 | පා පැදි සඳහා පමණක් ඇති ධාවන තීරුව ආරම්භය හෝ ඉදිරියට පැතිරීම |  | පාපැදි ධාවන තීරුවක් ආරම්භ වන හෝ පාපැදි ධාවන තීරුවක් නොකඩවා දිවෙන ස්ථානයක් |
| 82 | පාපැදි සඳහා පමණක් ඇති ධාවන තීරුව අවසානය |  | පාපැදි සඳහා පමණක් ඇති ධාවන තීරුවක් කෙළවර වන ස්ථානයක් |
| | පා පැදි සහ පදිකයන් සඳහා වූ ධාවන තීරුව ආරම්භය හෝ ඉදිරියට පැතිරීම |  | පාපැදි සහ පදිකයින් සඳහා වූ ධාවන තීරුවක් ආරම්භ වන හෝ පාපැදි හා පදිකයින් සඳහා වූ ධාවන තීරුවක් නොකඩවා දිවෙන ස්ථානයක් |
| | පා පැදි හා පදිකයන් සඳහා වූ ධාවන තීරුව අවසානය |  | පාපැදි සහ පදිකයින් සඳහා පමණක් ඇති ධාවන තීරුවක් කෙළවර වන ස්ථානයක් |
| | වීදි පදිකයින් සඳහා පමණයි |  | පදිකයින් සඳහා පමණක් ඇති වීදිය දැක්වීම |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# 2. පාලන සංඥා

## 2 (ඊ) රියදුරන්ට ප්‍රයෝජනවත් අනිකුත් තොරතුරු සංඥා

| | | | |
|---|---|---|---|
| | පදික උමං මග |  | පදිකයින් සඳහා උමං මගට පිවිසෙන ස්ථානයක් |
| | පදික පාලම |  | පදිකයින් සඳහා [illegible] පාලමට පිවිසෙන ස්ථානයක් |
| | අධිවේගී මාර්ගයකට ප්‍රවේශය |  | අධිවේගී මාර්ගයේ ආරම්භය හා අධිවේගී මාර්ගයට අදාළ නීති මේ ස්ථානයෙන් ඔබ්බට ක්‍රියාත්මක වන බව දැන්වීම |
| | අධිවේගී මාර්ගය අවසන්ය |  | අධිවේගී මාර්ගයේ අවසානය හා අධිවේගී මාර්ගයට අදාළ නීති අවසන් වන ස්ථානය |
| | මහජන දුරකථන ඇති ස්ථානය |  | මහජනයා සඳහා දුරකථන පහසුකම් ඇති ස්ථානය |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 2. පාලන සංඥා

### 2 (ඊ) රියදුරන්ට ප්‍රයෝජනවත් අනිකුත් තොරතුරු සංඥා

| | | | |
|---|---|---|---|
| | තොරතුරු මධ්‍යස්ථානය |  | මාර්ගය භාවිතා කරන්නන් සඳහා තොරතුරු ලබා ගත හැකි ස්ථානය |
| | කාර්මික ප්‍රදේශය |  | කාර්මික ප්‍රදේශයක් දැක්වීම |
| | ආපන ශාලාව |  | ආපන ශාලාවක් පිහිටි ස්ථානයක් |
| | විවේකාගාරය හෝ භෝජන ශාලාව |  | විවේකාගාරයක් හෝ භෝජන ශාලාවක් පිහිටි ස්ථානයක් |
| | හෝටලය |  | හෝටලයක් පිහිටි ස්ථානය |
| | ඉන්ධන හල |  | ඉන්ධන පිරවුම්හලක් පිහිටි ස්ථානය |
| | ආපදා සේවාව |  | ගරාජයක් හෝ කාර්මික වැඩ පලක් පිහිටි ස්ථානය |

චතුර රියදුරු පුහුණු පාසල. බෙලිඅත්ත

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

සලකුණු අංක 83




ධාවන තීරු 04 කින් යුත් මාර්ගයේ පදික මාරුවක් වශයෙන් හඳුන්වනු ලබන පයින් ගමන් කරන්නවුන් විසින් ධාවන පථය හරහා ගමන් කළ යුතු ස්ථානයක් දැක්වීමට යොදා ඇති මාර්ග ලකුණු කිරීම

**සීබ්රා ඉරි මඟින් පාලනය වන ප්‍රදේශ *Zebra Controlled Areas***

**මෙම සලකුණ මාර්ගය හරහා එක පැත්තක සිට අනික් පැත්ත දක්වා කහපාට වර්ණයෙන් සලකුණු කර ඇත. පයින් ගමන් කරන්නන්ට (පදිකයන්ට) මාර්ගය හරහා මාරු වීමට නීත්‍යානුකූල වූ අයිතිවාසිකමක් ද සහිතව ඇති එකම ආරක්ෂිත ස්ථානය මෙය වේ. පදිකයන් මාරු වන හරස් ඉරි සහිත සීමාව තුළ සිට මී. *15* ක් පමණ ඉදිරියට සහ පිටුපසට දඟර ඉරි (සීබ්රා ඉරි) සහිතව ආරක්ෂක කලාපයක් වෙන්කළ පදික මාරුවල දී මෙම ආරක්ෂක කලාපයේ වාහන නවතා තැබීම සහ ඉස්සර කිරීම තහනම් ය.**

**එමෙන්ම පදිකයෙකු පාර හරහා මාරු වීම සඳහා එක්පයක් හෝ පදික මාරුවට තැබූ පමණින් එම අවස්ථාවේ දී මෙම ස්ථානය පසු කිරීමට පැමිණෙන සියලුම වාහන රියදුරන් විසින් එම පදිකයා පාර හරහා මාරුවන තෙක් පදික මාරුව අසල සලකුණු කර ඇති නැවතුම් රේඛාවෙන් ඉදිරියට වාහනය ගමන් නොකළ යුතු අතර එම ස්ථානය අසල පදිකයාගේ ආරක්ෂාව සඳහා නතර කර ගත යුතුයි. මෙම නීතිය මාර්ගය දෙපැත්තෙන්ම ගමන් කරන වාහන සඳහා එක සේ බලපානු ලැබේ.**

**පදික මාරුවක් දුටුවිට අඩු වේගයකින්, අඩු ගියරයක, විමසිලිමත්ව ධාවනය කරන්න.**

චතුර රියදුරු පුහුණු පාසල බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

| සලකුණු අංකය | සලකුණේ නම | සලකුණ | විස්තරය |
| --- | --- | --- | --- |
|  | ශබ්ද තීරු (වේගය පැයකට කිලෝමීටර් 50 හෝ ඊට අඩු) |   | ශබ්ද පටු තීරු පදික මාරු වලට තියුණු වංගු හෝ වෙනත් ස්ථානවලට යොදා ඇත්තේ ළඟා වන වාහන වල වේගය අඩු කිරීම සුදුසු යැයි බලධාරියා විසින් නිගමනය කරන ලද හෙයිනි |
| | ශබ්ද පටු තීරු (වේගය පැයකට කිලෝමීටර් 50 ට වැඩිය) |  | ශබ්ද පටු තීරු පදික මාරුවලට තියුණු වංගු හෝ වෙනත් ස්ථානවලට යොදා ඇත්තේ ළඟා වන වාහන වල වේගය අඩු කිරීම සුදුසු යැයි බලධාරියා විසින් නිගමනය කරන ලද හෙයිනි |
|  | ශබ්ද පටු තීරු සමූහයක විස්තර |   | ශබ්ද පටුතීරුවක ඝනකම මිලි මීටර් 05 කට නොඅඩු හා මිලි මීටර් 07 කට නොවැඩි ප්‍රමාණයකින් රථ මාර්ගයේ උඩට මතු වී තිබිය යුතු ය. ප්‍රතිදීප්ත තීන්ත වලින් රේඛාව මාර්ගයේ මැද තීරුවේ ඍජුකෝණාස්‍රව ආලේප කර ඇත. |
| | පදික මාරුව හෝ මාර්ග ඡේදනය ඉදිරියෙන් |   | පදික මාරුවක් හෝ මාර්ග ඡේදනයක් ඉදිරියෙන් ළඟාවීම හෙමින් හෝ කි. මී. 10 ක වේගයෙන් ධාවනය කළ යුතු බවට රියැදුරන්ට අවවාද කිරීමයි. මාර්ග ඡේදනයකට හෝ පදික මාරුවකට මීටර් 50 ක් ඉදිරියෙන් මාර්ග ලකුණු කර ඇති අතර අදාළ මාර්ග වලට ගැසට් පත්‍රයේ පළ කර ඇති වේග සීමාවන් අනුව දුර ප්‍රමාණය වෙනස් වේ. |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

### 84 මාර්ගය බෙදී යන ස්ථානයක පිහිටුවන තනි හරස් නැවතුම් රේඛාව






20

අනතුරු හැඟවීමේ සංඥා අංක 20 පරිදි රථවාහන ආලෝක සංඥා ඉදිරියෙන් ඇති බවට ප්‍රදර්ශනය කර ඇති සංඥාව සහ පොලිස් නිලධාරියකු විසින් මංසන්ධියකදී වාහන හැසිරවීමේ රාජකාරියේ යෙදී සිටින අවස්ථාවකදී වාහන නතරකර ගැනීම සඳහා සංඥාවක් ලැබුණු විට මෙම හන්දිය ඡේදනය වන ස්ථානයට පැමිණීමේ දී සලකුණු කර ඇති මෙම සුදු තනි හරස් ඉර අසල රැඳී සිටිය යුතුයි. මෙම රේඛාවෙන් ඉදිරියට ගමන් කිරීම තහනම් වන අතර ආලෝක සංඥා මඟින් හෝ පොලිස් නිලධාරියා විසින් හෝ ගමන් කිරීමට අදාල සංඥාව ප්‍රදර්ශනය කළ වහාම මෙම ස්ථානයේ රැඳී නොසිට වහාම ඉවත්විය යුතුයි.

### 85 මාර්ගය බෙදී යන ස්ථානයක පිහිටුවන ද්විත්ව හරස් නැවතුම් රේඛාව




17



68




අනතුරු හැඟවීමේ සංඥා අංක 17 පරිදි ඉදිරියෙන් නවතිනු අවවාදය පරිදි පාලන සංඥා අංක 68 පරිදි වාහන නතර කල ගැනීම සඳහා මංසන්ධිය ඡේදනය වන ස්ථානයට සමාන්තරව පිහිටුවනු ලබන සංඥාවට ඉදිරියෙන් සමාන්තරව මාර්ගයෙ පිහිටුවනු ලබන ද්විත්ව සුදු ඉරි මෙය වෙයි.

එමෙන්ම, සුලු මාර්ගයක් විසින් ප්‍රධාන මාර්ගයක් ඡේදනය කරන අවස්ථාවේ සුළු මාර්ගයේ ගමන් කළ වාහන ප්‍රධාන මාර්ගයේ රා ගමනා ගමනයට ප්‍රමුඛත්වය දීම සඳහා වාහන නතර කිරීමට සුළු මාර්ගයේ මෙම ද්විත්ව සුදු ඉර පිහිටුවා ඇත. ප්‍රධාන මාර්ගයේ රථ ගමනා ගමනයට අවහිරයක් නොවන්නේ නම් පමණක් මෙම ඉරි දෙකෙන් ඉදිරියට ධාවනය කළ හැක.

### 86 ද්විත්ව හරස් කඩ ඉර සහිත රේඛාව






පාලන සංඥා 67 පරිදි මාර්ගය ඉඩ දෙනු සංඥාව මත පිහිටවන ලබන රේඛාවයි. මහාමාර්ග, කීපයක් සන්ධි වී ඡේදනය වන ස්ථානයේ හෝ සුළු මාර්ගයක් ප්‍රධාන මාර්ගයට ඡේදනය වන ස්ථානයේ දී මෙම රේඛාව පිහිටුවනු ලබයි. මෙම රේඛාවේ නියමය පරිදි රේඛාවෙන් ඉදිරියට ධාවනය කිරීමේ දී එම ඉදිරි මාර්ගයේ ධාවනය කරන වෙනත් වාහනයකට අවහිර කිරීම තහනම් වන අතර එම වාහන වලට ගමන් කිරීමට ප්‍රමුඛතාවය ලබාදීම සඳහා මෙම රේඛාව අසල නැවතී මාර්ගය ඉඩ දිය යුතුයි.

### 87 තනි හරස් කඩ ඉර



19





66

මෙම රේඛාව අනිවාර්යය වට රවුමක් පිහිටි මංසන්ධියක වාහන නතර කර ගැනීම සඳහා පිහිටුවන රේඛාවයි. අනතුරු හැඟවීමේ සංඥා 19 සහ පාලන සංඥා 66 පරිදි පිහිටුවා ඇත. මාර්ග කීපයකින් සමන්විත වටරවුමක් කරා ළඟාවුන වාහන එකම මොහොතකදී වට රවුමට ළඟා වීමේ දී දකුණේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම රේඛාව අසල නතර කළ යුතුයි.

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

### මාර්ගයේ මධ්‍ය රේඛාව

88




මාර්ගයේ මධ්මම රේඛා මාර්ගයේ මධ්‍යයේ හෝ මධ්‍යක්ෂයට ආසන්නව පිහිටුවා මධ්‍ය රේඛාව ලෙස සලකුණු කර ඇති බව දන්වා සිටියි. මෙම කඩ ඉර සහ පරතරය එක සමාන වන අතර, කඩ ඉර සමඟ පිහිටුවා ඇති පළිඟු බුබුලු සලකුණු ද සමාන දුරකින් පිහිටුවා තිබේ. මෙම කැඩුණු සුදු ඉරි සහිත මාර්ග පෙදෙසකදී ඉදිරියේ එන වාහන වලට අවහිරයක් නොවන්නේ නම් මෙම ඉරි හරහා ගමන් කළ හැක. ඉරි කපා ඉස්සර කළ හැකිය.දකුණ ට හැරවිය හැකිය.

89



### 90 මාර්ගයේ මධ්‍ය තනි සුදු දිගු රේඛාව



නොකැඩුණු තනි සුදු ඉර යනුවෙන් ද නම් කෙරෙන්නේ මෙම මධ්‍ය රේඛාවයි. මෙම රේඛාව නිසා මාර්ගය වම සහ දකුණ යනුවෙන් බෙදෙයි. රියදුරන් විසින් මෙම මධ්‍ය රේඛාවට වම් පසින් වාහන ධාවනය කළ යුතුයි. මෙම ඉර යට කර ගෙන ධාවනය කිරීම හෝ ඉර කපමින් ඉස්සර කිරීම හෝ නොකළ යුතුයි. නමුත් මංසන්ධියකදී එක එල්ලේ දකුණට හැරවීමක් සඳහා පමණක් මෙම ඉර කපා ධාවනය කළ හැකියි. "U" හැඩයට ආපසු හැරවීම හෝ ඉර ඇති සීමාව තුළ මාර්ගය දෙපස වාහන නතර කර තැබීම තහනම් වෙයි.



මාර්ගයේ ආසන්න පැත්තක ඇති අඛණ්ඩ රේඛාවෙන් වාහන ඉස්සර කිරීම තහනම්ය. එහෙත් හදිසි අනතුරු වළක්වා ගැනීම සඳහා දකුණු පසට හරවා අඛණ්ඩ රේඛාව හරහා පැදවීමට අවසර ඇත





මාර්ගය අයිනේ කඩ ඉරි රේඛාව පැත්තෙන් වාහන ඉස්සර කිරීමට කැඩුණු රේඛාව මාර්ගයේ ආසන්න පැත්තේ ඉස්සර කිරීමට මාර්ගය හරහා පැදවීමට සහ දකුණට හැරවීමට ඉඩ හැර ඇත



චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

91

### මාර්ගය මධ්‍යයේ පිහිටි ද්විත්ව සුදු රේඛාව



මෙම ද්විත්ව සුදු ඉරි සලකුණු කර ඇති මාර්ග පෙදෙසකදී මාර්ගය හරහා වාහන ගමන් කිරීම තහනම් බව දන්වා සිටියි. මෙම ඉර කපමින් ඉස්සර කිරීම ද ඉර යට කරමින් ධාවනය කිරීම ද තහනම් කර ඇත. මෙම ඉරි වලට වම් පසින් වාහන ගමන් කළ යුතුයි. නමුත් මාර්ගය මත පිහිටුවනු ලබන ඉරි සලකුණු වලට අදාල නීතිය, අනතුරක් වළක්වා ගැනීම සඳහා පමණක් කඩකිරීම නීති විරෝධී නොවේ. U හැඩයට ආපසු හැරවීමට හෝ ඉර ඇති සීමාව තුළ මාර්ගය දෙපස වාහන නතර කර තැබීම තහනම් වෙයි.



92

### මාර්ගය මත ධාවන තීරු සලකුණු



දිග පරතයක් සහිතව කෙටි ඉරි සලකුණු වලින් මෙම ධාවන තීරු සලකුණු කර ඇත. මංසන්ධියකට ළඟා වීමේ දී තමන්ට අවශ්‍ය ධාවන තීරුවකට මෙම ඉරි කපා ධාවනය කරමින් පැමිණිය හැකි අතර පිටු පසින් පැමිණෙන වාහන වලට අවහිර නොකළ යුතුයි.

93

### ධාවන පථයේ අයින දැක්වීමේ රේඛාව





මෙම සුදු රේඛාව මාර්ගය අයින දිගට වංගු සහිත ස්ථාන වල මෙන්ම වෙනත් අවශ්‍ය ස්ථානවල සලකුණු කර ඇත. රියදුරන් විසින් මෙම රේඛාවට දකුණු පසින් වාහන ධාවනය කළ යුතුයි.

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

94

### ධාවන පථයේ අයිනේ පිහිටුවා ඇති කහපාට රේඛාව



මෙම රේඛාව සලකුණු කර ඇති මාර්ග සීමාව තුළ එම පැත්තේ වාහන නවතා තැබීම තහනම් බවට නියෝග කර ඇති බව දන්වයි. මෙම රේඛාව පදික වේදිකා ගැට්ටේ සලකුණු කිරීමද මෙම නියෝගයට අදාල වෙයි.
මෙහි වාහන නතර කල හැකිය. එහෙත් රියදුරු අසුනේ සිටිය යුතුය. සාධාරණ කාලයක් තුල තැනැත්තකු වාහනයට නැගීම , බැසීම,බඩුබාහිරාදිය බෑම , පැටවීම කල හැකිය.

---

### වාහන නවතා තැබීම තහනම් ද්විත්ව රේඛා (කහ පැහැති රේඛා)




රථ මාර්ගයේ අයින දිගේ යම් දුරක් රථ වාහන නතර කර තැබීම, පැටවීම හා බැම හෝ තහනම් හෝ සීමා කර ඇති බවට රියැදුරන්ට දැන්වීමට (කහ පැහැති රේඛා)




චතුර රියදුරු පුහුණු පාසල බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

CHATHURA Driving School BELIATTA

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

95

### හරස් විකණි රේඛා සලකුණ




මෙම මාර්ග සලකුණ මංසන්ධියක හෝ එවැනි ස්ථානයක මාර්ගයේ දිග අතට සුදු පාටින් පිහිටුවා තිබේ. මෙම සලකුණට දෙපසින් වාහන ප්‍රතිවිරුද්ධව ගමන් කරයි. මංසන්ධියකදී මෙවැනි සලකුණක් පිහිටුවා තිබීමෙන් වාහන තදබදය වැඩි අවදානම් සහිත මාර්ග ඛූපතකට පිවිසුනා හා සමාන බව රියදුරන්ට දන්වා සිටියි

අධිවේගී මාර්ගය පිවිසුම හා පිටවීමේදී විශේෂයෙන් දක්නට ලැබේ.

96

### හරස් විකර්ණ රේඛා සලකුණ




මෙම සලකුණ වැඩි වශයෙන් මංසන්ධියක හෝ ධාවන තීරු බෙදී යන ස්ථානයක පිහිටුවා තිබේ. මෙම හරස් විකර්ණ රේඛාවේ නියෝගය නම් මෙම සලකුණ දෙපසින්ම වාහන ඉදිරියට ගමන් කරන බවත්, එසේ ගමන් කළ හැක්කේ තනි දිසාවට පමණක් බවටත් දැනුම් දෙයි. මෙම මාර්ග වල වමෙන් සහ දකුණෙන් ද වාහන ඉස්සර කළ හැකි නිසා වැඩි අවධානයක් යොමු කළ යුතුයි.

මෙම ස්ථානයද ඉහත සලකුණ මෙන්ම, අවදානම් සහිත රථ ගමනාගමනය පිහිටි ස්ථානයක් බවට පත් වී ඇති බව දන්වා සිටියි.

අධිවේගී මාර්ගය පිවිසුම හා පිටවීමේදී විශේෂයෙන් දක්නට ලැබේ.




දෙපැත්තෙන්ම එකම දිශාවකට එක්වීම. අවශ්‍යතාවට මිස නොයා යුතු අතර අවධානම් සහිත ගමනාගමන කලාපයක් බව පෙන්වාදෙයි.

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

97




### ඊතල සලකුණු

අනිවාර්යයෙන්ම ඉදිරියෙන් වමට හැර විය යුතු බවට රථ වාහනවල රියැදුරන්ට දැක්වීමටය

98




### ඊතල සලකුණු

අනිවාර්යයෙන්ම ඉදිරියෙන් දකුණට හැරවිය යුතු බවට රියැදුරන්ට දැක්වීමටය

99




### ඊතල සලකුණු

අනිවාර්යයෙන්ම කෙළින්ම ඉදිරියට ගමන් කළ යුතු බවට රියැදුරන්ට දැක්වීමටය

100




සුදුසු රථ ධාවන තීරයක් රියැදුරන්ට දැක්වීමට යොදා ඇති ලකුණු කිරීම

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

| | | |
|---|---|---|
| 101 | "හෙමින්"   | ඉදිරියෙන් විහව අවදානමක් ඇති බව දැක්වීමටත් ප්‍රවේශමෙන් ඉදිරියට ගමන් කළ යුතු බව හැඟවීමටත් යොදා ඇති මාර්ග ලකුණු කිරීම |
| 102 | ""නවතිනු""   | මෙම සලකුණු පසු කරන රියදුරන් " නවතිනු මාර්ග සංඥාව පැමිණෙමින් සිටින බවට අනතුරු හැඟවීමක් දැනුම් දෙයි. ඉදිරියේ ඇති මංසන්ධියේ සංඥා අංක 85 පරිදි ද්විත්ව සුදු හරස් රේඛා අසල නතර කරගැනීමටත්, ප්‍රධාන මාර්ගයකට පිවිසීමට ඇති බවත් දන්වයි.   |
| 103 |   | මහජනයා ප්‍රවාහනය කෙරෙන වාහන වල පාවිච්චිය සඳහා වෙන් කරන ලද වාහන ධාවන තීරුවක් දැක්වීමට යොදා ඇති මාර්ග ලකුණු කිරීම<br>**බස් රථ ධාවන තීරුව** |
| 104 |   | පාපැදි සඳහා වෙන් කරන ලද වාහන ධාවන තීරුවක් දැක්වීමට යොදා ඇති මාර්ග ලකුණු කිරීම<br>**පාපැදි ධාවන තීරුව** |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

| | | |
|---|---|---|
| 105 | "පාපැදිකරුවන් මාරුවන ස්ථානය"   | පාපැදිකරුවන් ධාවන පථය හරහා ගමන් කරන හෝ ධාවන පථයට ඇතුල් වන ස්ථානයක් හැඟවීමට යොදා ඇති මාර්ග ලකුණු කිරීම |
| 106 | මාර්ගයේ අවධානමක් ඇති වියහැකි බවට වන දිග ඉර සහ කෙටි පරතර සහිත රේඛාව   | මාර්ගයේ අවදානමක් පවත්නා බවට රථ වාහන වලට අනතුරු හැඟවීමට යොදා ඇති කැඩුණු ආයත රේඛාව හරහා ගමන් කිරීම, සැළකිල්ලෙන් යුතුව හැරවීම සඳහා අවසර දී ඇත. |
| 107 | බස් රථ හෝ පාපැදි ධාවන තීරුව වෙන්කර දක්වන රේඛාව   | බස් රථ හෝ පා පැදි ධාවනය කිරීම් මං තීරුවල ලකුණු කිරීමට මාර්ගයේ ගැටිය දෙසට දිගට පවත්නා රේඛාව |
| | | |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

**"පාපැදිකරුවන් මාරුවන ස්ථානය"**




බස්රථ හෝ පාපැදි ධාවනය කිරීම සඳහා සීමා ලකුණු කිරීමට මාර්ගයේ ගැටිය දක්වා වූ දිගට පවත්නා රේඛාව.




**" මාර්ගය ඉඩ දෙනු " යනුවෙන් මාර්ග ලකුණු කිරීම මාර්ගයේ ප්‍රධාන මාර්ගයේ මාර්ගයක / සුළු මාර්ගයක මාර්ග ඡේදනයට නැතහොත් වට රවුමකින් " මාර්ගය ඉඩ දෙනු " යන රේඛාව කලින් ලකුණු කරනුයේ කිසියම් හෝ වාහනයක් රේඛාවෙන් ඔබ්බට ගොස් ප්‍රධාන මාර්ගයේ මාර්ග ඡේදනයට, වටරවුමට, ඇතුල්වීමෙන් වාහනයට, රියැදුරුට ප්‍රධාන මාර්ගයේ ගමන් ගන්නා වෙනත් වාහනයක අයවලුන්ට හෝ වටරවුමේ අයට අනතුරු සිදුවීමට හැකි නිසාත් මෙවැනි අවස්ථාවක යාබද මාර්ගයේ හෝ වටරවුමේ ගමන් ගන්නා වාහනයේ රියැදුරන්ට වේගය හෝ මාර්ගය වෙනස් කිරීමටත් අවශ්‍ය බව රියැදුරන්නට දැන්වීම**




**ශබ්ද පටුසීරුවක ඝනකම මිලි මීටර් 05 කට නොඅඩු හා මිලි මීටර් 07 කට නොවැඩි ප්‍රමාණයකින් රථ මාර්ගයේ උඩට මතු වී තිබිය යුතු ය. ප්‍රතිදීප්ත තීන්ත වලින් රේඛාව මාර්ගයේ මැද තීරුවේ සෘජුකෝණාස්‍රව ආලේප කර**




**පදික මාරුවක් හෝ මාර්ග ඡේදනයක් ඉදිරියෙන් ළගාවීම හෙමින් හෝ කි. මි. 10 ක වේගයෙන් ධාවනය කළ යුතු බවට රියැදුරන්ට අවවාද කිරීමයි. මාර්ග ඡේදනයකට හෝ පදික මාරුවකට මීටර් 50 ක් ඉදිරියෙන් මාර්ග ලකුණු කර ඇති අතර අදාළ මාර්ග වලට ගැසට් පත්‍රයේ පළ කර ඇති වේග සීමාවන් අනුව දුර ප්‍රමාණය වෙනස් වේ.**

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

| | | |
|---|---|---|
| 108 |  | මංසන්ධි කොටුවක් කහපාට වර්ණයෙන් පිහිටුවා ඇත. මංසන්ධියේ පිහිටීම අනුව සලකුණේ හැඩය ද මංසන්ධියට අනුරූපව පිහිටා තිබේ. මෙම සලකුණ පිහිටුවීමේ මූලිකම අරමුණ දකුණට හරවන වාහන වලට ප්‍රමුඛතාවය සලසාදීම වේ. ඒ සමඟම කෙළින් ඉදිරියට ධාවනය කිරීමේදී මංසන්ධි කොටුවේ කොටසක් හෝ වැසෙන ලෙසට වාහන නතර කිරීමට නොහැකි අතර මංසන්ධි කොටුව හරහා දකුණට හැරවීමේ දී පාර හරහා ගමන් කිරීමේ දී, මාර්ගයේ කෙළින් ධාවනය කරන වෙනත් වාහන වලින් අවහිරයක් වේ නම් මංසන්ධි කොටුවේ නතරකර ගැනීමට හැකි අතර ඉහත අවහිරය මඟහැරුන වහාම මංසන්ධි කොටුවෙන් ඉවත්විය යුතු බවට නියම කර ඇත. |
| 109 |  | |
| |  | වාහනවලට රථ මාර්ගයේ ගැටිය දක්වා වාහන සමාන්තරව නතර කර තැබීමට සපයන ඉඩ ප්‍රමාණය දැක්වීමය |
| |  | වාහනවලට රථ මාර්ගයේ ගැටිය දක්වා ඍජුකෝණාකාරව නතර කර තැබීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය දැක්වීම |

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

| සලකුණු අංකය | විස්තරය |
|---|---|
| | වාහන<br>කෝණාකාරව<br>නවතා තැබීමේ ඉඩ<br><br><br>**රථ මාර්ගයේ ගැටිය දක්වා 30º 45º සහ 60º කෝණාකාරව සිටින සේ වාහන නවතා තැබීමට සපයා ඇති ඉඩ ප්‍රමාණය දැක්වීමය** |
| | වේග සීමාව<br><br><br>**රථ මාර්ගයේ වාහන ධාවනය කළ යුතු උපරිම වේග සීමාව දැක්වීමටය** |
| | වේග සීමාව නිමාව<br><br><br>**මාර්ගයේ වාහන ධාවන වෙය සීමාව නිමාව දැක්වීමටය** |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

## 3. මාර්ගය මත පිහිටුවන සංඥා

| සලකුණු අංකය | | විස්තරය |
|---|---|---|
| | ඇස්පල්ට් තීරු   | ඇස්පල්ට් පටු තීරු යොදනුයේ විරුද්ධ පැත්තෙන් එන වාහන ප්‍රවාහය නොබෙදූ මාර්ගයේ සිව් මං තීරු මාර්ගය වෙන් කිරීමටය. ඇස්පල්ට් තීරු පළලින් මිමී 75 ක් ද, උසින් මිමී 30 ක් ද, දිගින් මිමී 1200 ක් ද හෝ නිසි බලධාරියා විසින් භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සඳහා තීරණය කරනු ලබයි. ඇස්පල්ට් තීරු 600 මිමී සහ මධ්‍යයට අංශක 60 හැඩ තීරු ද වේ. ඇස්පල්ට් තීරු ඇස්පල්ට් කොන්ක්‍රීට් වලින් සකස් කර ඇත. දෙපස දිග අතට දිගටම සුදු පැහැති රේඛා ඇස්පල්ට් පටු තීරු රථ මාර්ගයේ සළකුණු කළ යුතු ය. වාහන ඇස්පල්ට් තීරු හරහා ධාවනය කොට ඉස්සර කිරීම තහනම් අතර දකුණට හරවන වාහන ආරක්ෂා සහිතව තීරු හරහා හැරවීම කළ හැකිය. |
| | මධ්‍යනය ළකුණු කිරීම  | මි. මි. 600 පරතරය සිටින සේ සළකුණු කරන ලද දිගටම පවත්නා අඛණ්ඩ රේඛා දෙකක් සිව් මං තීරු නොබෙදූ මාර්ගය මත විරුද්ධ පැත්තෙන් ධාවනය වන රථ වාහන වෙන් කිරීම මධ්‍යය නියෝජනය සේ සැළකේ. මේ රේඛා දෙක හරහා දකුණට හැරවීමට වාහන වලට අවසර දී ඇත. එසේ වුව ද වාහන ඉස්සර කිරීමේ අරමුණින් මෙම රේඛා හරහා ධාවනය කිරීමට අවසර නැත. |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (අ) මග පෙන්වීමේ පූර්ව සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| **110** | සිතියම් වර්ගයේ පූර්ව මග පෙන්වීමේ සලකුණ හතර මංසන්ධිය |  | ඉදිරියෙන් තිබෙන සිව් මංසන්ධියක සිට විහිදෙන මාර්ගයක් ඔස්සේ තිබෙන වැදගත් ගමනාන්තයන්හි නම් හා ඒවායේ අදාළ දිශාවන් දුර සහ මාර්ග අංක පෙන්නුම් කිරීම |
| **111** | සිතියම් වර්ගයේ පූර්ව මග පෙන්වීමේ සලකුණ තුන් මංසන්ධිය |  | ඉදිරියෙන් තිබෙන තුන් මංසන්ධියක සිට විහිදෙන මාර්ගය ඔස්සේ තිබෙන වැදගත් ගමනාන්තයන්හි නම් හා ඒවායේ අදාළ දිශාවන් දුර සහ මාර්ග අංක පෙන්නුම් කිරීම |
| **112** | අයි. එස්. (එන්.එච්)-010 විකල්පය |  | සලකුණ සඳහා විකල්පය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (අ) මග පෙන්වීමේ පූර්ව සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
| --- | --- | --- | --- |
| | උඩින් නැංවූ සිතියම් වර්ගයේ සලකුණ |  | මාර්ගයන් ඡේදනය වන ස්ථානයක සිට විහිදෙන මාර්ග ඔස්සේ තිබෙන වැදගත් ගමනාන්තයන්හි නම්, මාර්ග අංක සහ ඒවාට ඇති දුර හෝ ගමනාන්තයේ ස්වභාවය පෙන්නුම් කරනු ලබන සංකේතයක් පෙන්නුම් කිරීම සඳහා වන උඩින් නැංවූ සලකුණ |
| | උඩින් නැංවූ පූර්ව උපදේශන සලකුණ |  | ඉදිරියෙන් තිබෙන මාර්ගයන් ඡේදනය වන ස්ථානයක සිට දිවෙන මාර්ග ඔස්සේ තිබෙන වැදගත් ගමනාන්තයන්හි නම් සහ දිශාවන් පෙන්නුම් කරනු ලබන උඩින් නැංවූ සලකුණ |
| | උඩට නැංවූ මං තීරු පෙන් කිරීමේ සලකුණ |  | ඉදිරියෙන් තිබෙන මාර්ගයන් ඡේදනය වන ස්ථානයක සිට පෙන්නුම් කරනු ලබන ගමනාන්තයන් වෙත ළඟාවීම සඳහා ගමන් කළ යුතු ධාවන තීරු පෙන්නුම් කරනු ලබන උඩින් නැංවූ සලකුණ |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (අ) මග පෙන්වීමේ පූර්ව සංඥා

| සලකුණු අංකය | සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 113 | මාර්ගයේ වැඩ සඳහා බාධක පුවරුව | <br>5.1** | රථ මාර්ගයේ හා මාර්ග උරහිස් මත මාර්ග වැඩ කෙරෙන මාර්ග සීමාවන් දැක්වීම සඳහා (කළු සහ කහ පැහැයෙන්) |
| 114 | මාර්ගයේ වැඩ කිරීම සඳහා විකල්ප බාධක පුවරුව | <br>5.2** | මාර්ගයේ වැඩ කිරීමේ දී තාවකාලිකව මාර්ගයේ වෙනස් කිරීම් දිශාව පෙන්නුම් කිරීම (කළු සහ කහ පැහැයෙන්) |
| | පැති අවහිරය සලකුණු |  | මාර්ගයේ කොටස රියැදුරන්ට මං තීරුවේ පටු ස්ථාන පැහැදිලිව නොපෙනෙන ස්ථානය පෙන්නුම් කිරීම ( කළු සහ කහ පැහැයෙන් හෝ රතු හා සුදු පැහැයෙන්) |
| | ස්ථිර භාවිතය සඳහා දිශා පෙන්නුම් පුවරුව | <br>5.4* | මාර්ගයේ තියුණු වංගු සහ වංගුවේ දිශාව පෙන්නුම් කිරීමටය (රතු සහ සුදු) |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

## 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

### 4 (ආ) මග පෙන්වීමේ සංඥා

| සලකුණු අංකය | සලකුණු නාමය | සලකුණ | විස්තරය |
|---|---|---|---|
| 115 | මග පෙන්වීමේ සලකුණු ස්ථානය හා දුරඅයි. එස්. |  | මාර්ගයෙන් ඡේදනය වන ස්ථානයක සිට තිබෙන වැදගත් ගමනාන්තයක නම සහ ඊට ඇති දුර |
| 116 | සලකුණු ස්ථානයක හා මාර්ගය |  | මාර්ගයන් ඡේදනය වන ස්ථානයක සිට තිබෙන වැදගත් ගමනාන්තයක නම සහ ගමනාන්තයේ ස්වභාවය පෙන්නුම් කිරීම සඳහා වන සලකුණක් පෙන්නුම් කිරීම |
| 117 | පරිපාලන ප්‍රදේශයක ආරම්භය |  | පරිපාලන ප්‍රදේශයකට ඇතුළුවීමේ සීමාව පෙන්නුම් කිරීම සහ පරිපාලන ප්‍රදේශයේ නම |
| 118 | පරිපාලන ප්‍රදේශයක අවසානය |  | පරිපාලන ප්‍රදේශයකින් පිටවීමේ සීමාව පෙන්නුම් කිරීම සහ පරිපාලන ප්‍රදේශයේ නම |

### 4 (ඇ) ස්ථිර කිරීමේ සංඥා

| | | | |
|---|---|---|---|
| 119 | දුර ප්‍රමාණය තහවුරු කිරීම |  | මාර්ගයක දිශාව හා එහි ගමනාන්තය තහවුරු කිරීම සඳහා විශාල සංවර්ධිත ප්‍රදේශයක හෝ මහ නගර සහා ප්‍රදේශයක එහි පිටවන ස්ථානයේ සිට තිබෙන මාර්ගය ඔස්සේ වන ස්ථානයන් සඳහා කිලෝමීටර් වලින් දුර සහ ඒවායේ නම පෙන්නුම් කිරීම |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඈ) අධිවේගී මාර්ග සංඥා

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| පූර්ව මග පෙන්වීමේ සලකුණ (සිතියම් වර්ගයේ) එකිනෙකට දුරස් වී එක්වීම |  | හුවමාරුවක් පිහිටා ඇති ස්ථානයේ නම, ඊට ඇති දුර සහ පිටවීමේ අංකය පෙන්නුම් කිරීම. |
| උඩින් නැංවූ මංතීරු වෙන් කිරීමේ සලකුණ |  | ඉදිරියෙන් තිබෙන හුවමාරුවක සිට තිබෙන මාර්ග ඔස්සේ වන වැදගත් ගමනාන්තයන් වෙත ළඟාවීම සඳහා ගමන් කළ යුතු ධාවන තීරු, එම හුවමාරුවේ අංකය සහ ඊට ඇති දුර පෙන්නුම් කිරීම. |
| උඩින් නැංවූ පුවරු මග පෙන්වීම |  | ඉදිරියෙන් තිබෙන හුවමාරුවක සිට තිබෙන මාර්ග ඔස්සේ වන වැදගත් ගමනාන්තයන්හි නම් පෙන්නුම් කිරීම. |
| මග පෙන්වීමේ සලකුණ බෑවුමෙන් පිටවීම |  | අධිවේගී මාර්ගයක පිටවීමේ තීරුවෙහි පිහිටීම හා දිශාව පෙන්නුම් කිරීම. |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

0742692585 / 0716920017

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඈ) අධිවේගී මාර්ග සංඥා

| | | |
|---|---|---|
| පූර්ව මග පෙන්වීමේ සලකුණ (සිතියම් වර්ගයේ) |  | ඉදිරියෙන් තිබෙන හුවමාරුවකට ඇති දුර පෙන්නුම් කිරීම. හුවමාරුවේ සිට තිබෙන මාර්ග ඔස්සේ වන වැදගත් ගමනාන්තයන්හි නම්, ඒවායේ අදාළ දිශාවන් හා මාර්ග අංක පෙන්නුම් කිරීම |
| මග පෙන්වීමේ සලකුණ (සිතියම් වර්ගයේ) එකිනෙකට දුරස් වී එක්වීම |  | හුවමාරුවක පිටවීමේ තීරුවෙහි සිට තිබෙන මාර්ග ඔස්සේ වන වැදගත් ගමනාන්තයන්හි නම් හා ඒවායේ මාර්ග අංක පෙන්නුම් කිරීම |
| තහවුරු කෙරෙන සලකුණ |  | ඉදිරියෙන් තිබෙන ප්‍රධාන නගරවල නම්, ඔවුන් ගමන් කරනු ලබන මාර්ගයේ සිට ඒවාට ඇති දුර පෙන්නුම් කිරීම සඳහා උඩින් නැංවූ සලකුණ |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඈ) අධිවේගී මාර්ග සංඥා

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| සලකුණේ දැක්වෙන තොරතුරට ඇති දුර |  | සලකුණේ සිට තොරතුරෙහි පිහිටීමට ඇති දුර පෙන්නුම් කිරීම |
| තොරතුරු සලකුණේ දිග |  | තොරතුරු සලකුණ මගින් ලබා දෙනු ලබන තොරතුරෙහි දිග පෙන්නුම් කිරීම |
| ඕ. එස්. ඩී. - 18 සලකුණට හදිසි ඇමතුම් කොටස සවි කිරීම |  | ඕ.එස්.ඩී. - 18 සලකුණට සවි කළ යුතු පොදු දුරකථනය පෙන්නුම් කිරීම හදිසි ඇමතුම් ලබා ගැනීම සඳහා භාවිතා කළ හැක. |

## 4 (ඉ) මාර්ග අංක සලකුණු

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| "ඒ" පන්තියේ මහාමාර්ග සඳහා මාර්ග අංක සලකුණ |  | "A" පන්තියේ මාර්ග සඳහා මාර්ග අංක සලකුණ |
| "බී" පන්තියේ මහාමාර්ග සඳහා මාර්ග අංක සලකුණ |  | "B" පන්තියේ මාර්ග සඳහා මාර්ග අංක සලකුණ |
| පළාත් මාර්ග සහ ප්‍රාදේශීය සභා මාර්ග අංක සලකුණ |  | ජාතික නොවන මහා මාර්ග සඳහා මාර්ග අංක සලකුණ (පළාත් සහ ප්‍රාදේශීය සභා මාර්ග) |
| අධිවේගී මාර්ග සඳහා මාර්ග අංක සලකුණ |  | අධිවේගී මාර්ග සඳහා මාර්ග අංක සලකුණ |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

## 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

### 4 (ඊ) ආලෝක සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| රතු එළිය |  | රතු එළියක් "නතර කරනු" යන්න හා "වාහන නතර කරනු " යන රේඛාවෙන් ඔබ්බට නොයා යුතු බවයි. හෝ "නතර කරනු" රේඛාවක් නොතිබුණේ නම් එයින් ඔබ්බට නොයායුතු හෝ සංඥාව මධ්‍යයේ සඳහන්ව තිබුණේ නම් විරුද්ධ පැත්තේ මාර්ග ඡේදනයක් වේ නම් මාර්ග ඡේදනයට ඇතුළත් නොවිය යුතු හෝ පදික මාරුව ඇති කොටසේ මාර්ග ඡේදනය වන කොටසට නොයා යුතු බවට අදහස් කෙරේ |
| රතු සහ කහ එළිය |  | රතු සහ කහ ආලෝකය "නතර කරනු" යි අදහස් කෙරේ. කහ පාට ආලෝකය රතු එළිය සමඟ දැල්වේ නම් එයින් හැඟෙන්නේ සංඥාව වෙනස් වන බවයි. කොළ පැහැති එළිය දර්ශනය වන තෙක් ඉදිරියට නොයා යුතු බවට අදහස් කෙරේ. **මෙම අවස්ථාවේ යාමට සූදානම් විය යුතුය** |
| කොළ එළිය |  | කොළ එළියෙන් වාහන සෘජුවම ඉදිරියට යා යුතු හෝ වමට හෝ දකුණට ආරක්ෂා සහිතව ධාවනය කළ යුතු බව අදහස් කෙරේ. කෙසේ වෙතත් කොළ පැහැති එළියෙන් මාර්ග ඡේදනයක දී වාහන පාලනය කෙරෙන්නේ නම් රියැදුරන්ට වාහන තදබදයක්, තමන් ධාවනය කරන්නට බලාපොරොත්තු වන දිශාවට ඇත්තේ නම් සහ මාර්ග ඡේදනයකට ඇතුල් වන්නේ නම් බොහෝ විට ඔවුන් ඊළඟ අවස්ථාව පැහැදිලි කරගෙන නැති නිසා රියැදුරන්ට ඉදිරියට ධාවනය කිරීමට අනුමැතිය නොදිය යුතු යයි අදහස් කෙරේ. |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඊ) ආලෝක සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| කහ එළිය |  | කහ එළිය තනිවම දැල්වෙන්නේ නම් එයින් අදහස් කරන්නේ වාහනය "නතර කරනු" යන රේඛාව පසු නොකළ යුතු බවයි හෝ සංඥා රේඛාවෙන් ඔබ්බට නැතහොත් එය බොහෝ දුරට "නතර කරනු" රේඛාවට කිට්ටු නම් හෝ සංඥා එළිය දැල් වූ විට "නතර කරනු" සංඥාව පසු කිරීමට පෙර ආරක්ෂා සහිතව වාහනය නතර කළ නොහැකි හෝ රේඛා සංඥාවෙන් ඔබ්බට ධාවනය නොකළ යුතු ය |
| ජ්වලනය වන කහ එළිය<br>**නිවෙන දැල්වෙන කහ පැහැය.** |  | කහ පැහැති ජ්වලනයවන තනි එළිය යනුවෙන් අදහස් කරන්නේ රියැදුරන් තම වාහනයේ වේගය අඩු කර සැළකිලිමත්ව ධාවනය කිරීමයි. දැල්වෙන ජ්වලිත කහ පැහැයට හුරු ආලෝකය භාවිතා කළ යුත්තේ තුන් පැහැති ක්‍රමය වාහන අඩු අවස්ථාවල දී මෙන්ම විශේෂයෙන් රාත්‍රී කාලයේ දී ය. දැල් වූ කහ පැහැති ආලෝක සංඥා එහි ඡේදන ස්ථානවල යොදවනු ඇති ඒවා ක්‍රියාත්මක කරනුයේ වාහන ආලෝක ක්‍රියාත්මක නොවන අවස්ථාවල දීය |

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| කොළ පැහැති ඊතලය |  | කොළ පැහැති ඊතලය දක්වා ඇත්තේ දිශාව අනුව වාහන ධාවනය කළ යුතු බවය |
| කොළ පැහැති ඊතලය සහ ඊතල වල විකල්ප තත්ත්වයන් |  | 1කොළ පැහැති ඊතලයේ විකල්ප පිහිටීම වන්නේ ඊතලය යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය<br>**රතු කහ සමග අදාල දිශාවට කොලපාට ඊතලය** |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඊ) ආලෝක සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| පී. 2 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී2 හි විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය |
| පී. 1 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී1 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව රථ වාහන අනුගමනය කළ යුතු බවය |
| පී. 3 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී3 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව රථ වාහන අනුගමනය කළ යුතු බවය |
| පී. 1 සහ පී. 2 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී1 සහ පී2 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය |
| පී. 1 සහ පී. 3 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී1 සහ පී3 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය |

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| පී. 4 සහ පී. 5 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී2 සහ පී5 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය |
| පී. 3 සහ පී. 6 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී3 සහ පී6 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය |
| පී. 4 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී4 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය |
| පී. 4 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී4 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

**රතු කහ සමග අදාල දිශාවට කොළපාට ඊතලය**

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඊ) ආලෝක සංඥා

| | සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|---|
| | පී. 1 සහ පී. 4 පිහිටීම |  | කොළ පැහැති ඊතලයේ පී1 සහ පී4 විකල්ප පිහිටීම ඊතල යොමු කොට ඇති දිශාව වාහන අනුගමනය කළ යුතු බවය |
| 1 | සිව් මංසන්ධියේ උඩ නැංවූ ආලෝක සංඥා |  | වාහන කොළ පැහැති ආලෝක සංඥා සහ ඊතල යොමු කොට ඇති දිශාව අනුගමනය කළ යුතු ය |
| 2 | තුන් මංසන්ධියේ උඩ නැංවූ කොළ පැහැති ආලෝක සංඥා |  | වාහන කොළ පැහැති ආලෝක සංඥා සහ ඊතල යොමු කොට ඇති දිශාව අනුගමනය කළ යුතු ය |

රතු කහ සමග අදාල දිශාවට කොලපාට ඊතලය

## පදිකයන් සදහා ආලෝක සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| පදිකයින් සඳහා ආලෝක සංඥා |  | කොළ පැහැති මිනිසා ආලෝක සංඥාවේ දිස් වූ පසු පදිකයින්ට ගමන් කිරීමටය |
| එල්.එස්.පී -01ට විකල්ප |  | කොළ පැහැති මිනිසා ආලෝක සංඥාවේ දිස් වූ පසු පදිකයින්ට ගමන් කිරීමටය |
| පදිකයින් ක්‍රියාත්මක කරන ආලෝක සංඥා |  | බොත්තම තද කර කොළ පැහැති සංඥාව ලැබුණු පසු යාමට හෝ මාරුවීමටය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

## 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

### 4 (උ) පොලිස් නිලධාරීන් විසින් කරනු ලබන හස්ත සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| "නතර කරනු" සංඥා ස්ථානයට ඉදිරියෙන් වාහන ළඟාවීම |  | ඉදිරියෙන් ළඟා වන වාහනවලට නතර කිරීමට විධාන කිරීම |
| සියලුම වාහන නතර කරනු |  | සියලුම රථ වාහනවලට නතර කිරීමට විධාන කිරීම |
| ඉදිරියෙන් හා පසුපසින් පැමිණෙන සියලුම වාහන නතර කරනු |  | ඉදිරියෙන් හා පසුපසින් පැමිණෙන සියලුම වාහන නතර කිරීමට විධාන කිරීම |
| දකුණු පැත්තෙන් පැමිණෙන වාහන වලට ඉදිරියට යාමට |  | දකුණු පැත්තෙන් පැමිණෙන වාහන වලට ඉදිරියට යාමට විධාන කිරීම |
| ඉදිරියෙන් පැමිණෙන වාහන වලට ඉදිරියට යාමට |  | ඉදිරියෙන් ළඟා වන වාහනවලට ඉදිරියට යාමට විධාන කිරීම |
| වම් පසින් පැමිණෙන වාහන වලට ඉදිරියට යාමට |  | වම් පසින් ළඟා වන වාහනවලට ඉදිරියට යාමට විධාන කිරීම |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඌ) රිය පදවන්නන්ගේ හස්ත සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| දකුණට හැරවීම | <br><br><br> | රියදුරු තමන්ට දකුණට යාමට හෝ හැරවීමට අවශ්‍ය බැව් මාර්ගය හාවිතා කරන අනෙකුත් අයට දැන්වීම |
| වේගය අඩු කිරීම හෝ නතර කිරීම | <br><br> | රියදුරු තමන්ට වාහනයේ වේගය අඩු කිරීමට හෝ නතර කිරීමට අවශ්‍ය බැව් අනිකුත් මාර්ග හාවිත කරන්නන්ට දැන්වීමට විශේෂයෙන් වැදගත් වන්නේ සීබ්‍රා පාර මාරුවීම්වල දී පදිකයන්ට මෙන්ම අනෙකුත් අයට ද තමන්ගේ වේගය අඩු කිරීම හෝ වාහනය නතර කිරීමට යන බව දැන්වීමට |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඌ) රිය පදවන්නන්ගේ හස්ත සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| වමට හැරවීම |  | රියදුරු තමන්ට වමට යාමට හෝ හැරවීමට අවශ්‍ය බැව් මාර්ග භාවිතා කරන්නන්ට දැන්වීම |

## 4 (ඌ) රිය පදවන්නන්ගේ සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| වේගය අඩු කිරීම හෝ නතර කිරීම (තිරිංග (ආලෝක සංඥා) |  | රියදුරු තමන්ට වාහනයේ වේගය අඩු කිරීමට හෝ නතර කිරීමට අවශ්‍ය බැව් අනෙකුත් මාර්ග භාවිතා කරන්නන්ට දැන්වීමටය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඌ) රිය පදවන්නන්ගේ සංඥා

| සංඥාවේ නම | සංඥාව | විස්තරය |
|---|---|---|
| දකුණට හැරවීම (ආලෝක සංඥා) |  | රියදුරු තමන්ට දකුණු පැත්තට යාම හෝ දකුණට හැරවීම අවශ්‍ය බැව් අනෙකුත් මාර්ග භාවිතා කරන්නන්ට දැන්වීම |
| වමට හැරවීම (ආලෝක සංඥා) |  | රියදුරු තමන්ට වම් පැත්තට යාම හෝ වමට හැරවීම අවශ්‍ය බැව් අනෙකුත් මාර්ග භාවිතා කරන්නන්ට දැන්වීමටය හෝ වම් පැත්තට නතර කිරීම |
| වේගය අඩු කිරීම හෝ නතර කිරීම (තිරිංග (ආලෝක සංඥා) |  | රියදුරු තමන්ට වාහනයේ වේගය අඩු කිරීමට හෝ නතර කිරීමට අවශ්‍ය බැව් අනෙකුත් මාර්ග භාවිතා කරන්නන්ට දැන්වීමටය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඒ) ධ සංඥා

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| ඊතලය හිස් සළකුණු |   | මාර්ගයේ වංගුවල එකෙල්ල පෙන්වීම සඳහා (රතු සහ සුදු) |
| මාර්ගයේ පැති යශ්ටි |  | රියැදුරන්ට මාර්ගයේ අයින සහ මාර්ග එකෙල්ල පෙන්නුම් කෙරෙතත් පැති දක්වන "රතු සහ සුදු වර්ණ" යොදවමින් රියැදුරන්ට උපදව සහිත මාර්ගයේ අයින පෙන්නුම් කළ හැක |
| රථ වාහන කේතුව |   | තාවකාලික අවහිරය සඳහා මාර්ග අනුගමනය කිරීම හෝ පසු කිරීම කළ යුතු බව සළකුණු කිරීම සඳහා රථ වාහන පාලන උපකරණයකි |
| වාහන නවතා තැබීම තහනම් බවට රථ වාහන කේතුව |   | වාහන නවතා තැබීම තාවකාලිකව තහනම් කිරීමේ රථ වාහන පාලන උපකරණයකි |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (එ) ධ සංඥා

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| වාහන නවතා තැබීම තහනම් රථ වාහන ආරක්ෂක කණුව |  | රථවාහන නවතා තැබීම තහනම් කිරීම සඳහා මාර්ග උරහිසේ හෝ පදික වේදිකාවේ සිටුවන කණුව. |
| "නවතිනු" යන පුවරු |  | පදිකයන් මාරුවීම් හෝ මාර්ගයේ වැඩ කරන කොටසේ වාහන වල රියැදුරන් නතර කිරීමට හෝ යන ලෙස දැක්වීමට රථ වාහන නියාමකයන් විසින් භාවිතා කෙරේ |
| මාර්ග භාණ්ඩ සඳහා රථ වාහන ආරක්ෂක කණු |  | මෙම ගමනාගමන පාලන උපකරණය අවශ්‍ය වන්නේ ගමනාගමන පාලනයට සහ මාර්ග භාණ්ඩ ආරක්ෂා කිරීමටය D 23 (වර්ණය සුදු කළු හෝ සුදු රතු වශයෙන් විය යුතු ය.) |
| රථ වාහන හා පෙරහැර පාලනයට ඇති වාහන බාධකය |  | මෙය ගමනාගමන පාලනය කිරීමට සහ මහජන පෙරහැරවල් පාලනය කිරීමටය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (එ) ධ සංඥා

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| ලන්තෑරුම් |  | මාර්ග වැඩ වල උපද්‍රව තත්ත්වයන් මාර්ග භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සඳහා දැන්වීමට රාත්‍රී කාලයේ දී භාවිතා කරන ආලෝක උපකරණය |
| ආලෝක ධාරා පාටව |  | මාර්ගය භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සඳහා මාර්ගයේ වැඩ වල දී රාත්‍රී කාලයේ දී දැල්වීමට භාවිතා කෙරේ |
| විදුලි ලාම්පු (රතු සහ කහ පාට) |  | රාත්‍රී කාලයේ දී මාර්ගය භාවිත කරන්නන්ගේ ආරක්ෂාව සඳහා පාවිච්චි කිරීමට සවි කර ඇත |
| ගැටීම් වැළැක්වීමට අනතුරු හැඟවීමේ සලකුණු |  | ගැටීම් වැළැක්වීමට දිගු වාහන වල පසුපස හෝ පැතිවල දිගු වාහන පැමිණෙන බැව් දැන ගැනීමට සවි කරනු ලැබූ හෝ අදිනු ලබන්නකි |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (එ) ධ සංඥා

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| අක්‍රිය වාහන සලකුණු |  | ආපදාවට පත් වාහනය බවට දැන ගැනීමට වාහනයේ පැත්තක ප්‍රදර්ශනය කරනු ලබන සලකුණකි |
| රතු කොඩිය |  | මහාමාර්ගයේ ව්‍යාපෘතීන් සඳහා බඩුබාහිරාදිය රැගෙන යන වාහන වල 1.5 මීටර් ප්‍රමාණයේ වාහනයේ පසුපස හෝ ඉදිරිපස රතු කොඩියක් දිවා කාලයේ දී සවි කළ යුතු අතර රාත්‍රී කාලයේ දී සුදු හෝ තෝරා ගත් කහ පැහැති එළියක් වාහනේ කෙළවරේ ගැටීම් වැළැක්වීම සඳහා සෑහෙන දුරකට පෙනී යන ආකාරයෙන් සවි කළ යුතු ය |
| රථ වාහන නියාමන කංචුකය |  | රථ වාහන පාලන කිරීම සඳහා සහකාර පොලිස් අධිකාරි විසින් අනුමත කරන ලද කංචුකයන් රථ වාහන නියාමකයන් විසින් ඇඳ ගත යුතුය |
| රථ වාහන පොලිස් නිලධාරීන්ගේ කංචුකය |  | රථවාහන පාලනය කිරීම සඳහා පොලිස් නිලධාරීන් විසින් ඇඳ සිටිය යුතු ය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (ඒ) විවිධ සංඥා

ප්‍රවාහන වාහනවල සවිකරන ලද අනතුරු හඟවන තහඩු

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| පුපුරණ ද්‍රව්‍ය |  | සංකේතය (පුපුරණ බෝම්බයක්)ඃ කළු පැහැය පසුබිමඃ අංක 1.1 සහ 1 සහිත අඩු තැඹිලි පැහැය |
| ගිනි ගන්නා වායූ |  | සංකේතය (ගිනි දැල්ල) සුදු පැහැය පසුබිමඃ අංක 2 සහිත රතු පැහැය |
| ගිනි ගන්නා ද්‍රව |  | සංකේතය (ගිනිදැල්ල)ඃ සුදු පැහැය පසුබිමඃ අංක 3 සහිත රතු පැහැය |
| ගිනි ගන්නා සුළු ඝණ ද්‍රව්‍ය |  | පසුබිමඃ අංකයක් සහිත සිරස් රතු පැහැ තීරු සමග සුදු පැහැය |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# 4. තොරතුරු සහ වෙනත් විවිධ සංඥා

## 4 (එ) විවිධ සංඥා

### ප්‍රවාහන වාහනවල සවිකරන ලද අනතුරු හඟවන තහඩු

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| ඔක්සිජන් වායු කාරකය |  | සංකේතය (රවුම මත ගිනිදැල්ල) : කළු පැහැය පසුබිම: කහ පැහැය |
| බෝවන රෝග ද්‍රව්‍ය |  | සංකේතය (රවුම මත අධිස්ථාපනය කරන ලද චන්ද්‍රවංක තුනක්) කළු පැහැය පසුබිම: අංක 6 සහිත සුදු පැහැය |
| විකිරණශීලී ද්‍රව්‍ය |  | සංකේතය (ඛණ්ඩ තුනකින් වට වී ඇති රවුම): කළු පැහැය පසුබිම: ඉහළ භාගය කහ පැහැය පහළ සුදු පැහැ පසුබිමේ අංක 7 සහිත සෘජුකෝණාස්‍රය |
| මළ බැදෙන ද්‍රව්‍ය |  | සංකේතය (ද්‍රියර, වීදුරු බඳුන් දෙකකින් ඉහිරී යන සහ අතකට හා ලෝහමය දණ්ඩකට වැටෙන) කළු පැහැය පසුබිම: ඉහළ භාගය සුදු පැහැය, පහළ භාගය අංක 8 සහිත කළු පැහැය |
| විවිධ ද්‍රව්‍ය |  | සංකේතය (නැත), පසුබිම: සුදු පැහැය සමග ඉහළ භාගය සිරස් කළු පැහැ තීරු සහ අංක 9 |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

# වාහන නතර කර තැබීම සඳහා වූ තහනම් දුර

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| මාර්ග ඡේදනයන්හි තහනම් දුර |  | ප්‍රධාන මාර්ගයේ මාර්ග ඡේදනයක දී වාහන නතර කර තැබීම හා සුළු මාර්ගයක දී වාහන නතර කර තැබීම සඳහා වූ තහනම් කර ඇති හෝ සීමා කර ඇති දුර ප්‍රමාණයන් ප්‍රධාන මාර්ගයේ මාර්ග ඡේදනයක දී මීටර් 25ක් ද අනිකුත් මාර්ගයක දී මීටර් 10ක් ද වේ |
| |  | |
| |  | |
| |  | |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.

## වාහන නතර කර තැබීම සඳහා වූ තහනම් දුර

| සලකුණේ නම | සලකුණ | විස්තරය |
|---|---|---|
| බස් නැවතුම්වල දී තහනම් දුර ප්‍රමාණය |  | බස් නැවතුමකට ළඟා වන මීටර් 30 ඇතුළත වාහන නතර කර තැබීම තහනම් ය. නැතහොත් සීමා කර ඇති අතර එසේම බස් රථ නතර කර තබා පිටව යන පැත්තේ මීටර් 15 ක් ඇතුළත නතර කර තැබීම තහනම් |
| "බස් තෙරුව"වල දී ප්‍රදේශයට තහනම් දුර ප්‍රමාණය |  | බස් නතර කර තැබීම සඳහා වට කොට ඇති "බස් තෙරුව" වෙත ළඟා වීමට ඇති කොටසේ මීටර් 15 ක් ඇතුළත ද, පිටව යන කොටසේ මීටර් 10 ක් ඇතුළත ද වාහන නතර කර තැබීම තහනම් හෝ සීමා කර ඇත. |
| පදික මාරුවල සිට තහනම් දුර ප්‍රමාණය |  | පදික මාරුවට ළඟා වන පැත්තෙන් මීටර් 30 ක් ද පිටවන පැත්තෙන් මීටර් 15 ක් තුළ රථ වාහන නතර කර තැබීම තහනම් හෝ සීමා කර ඇත. |
| සංඥාපිත මාර්ග ඡේදනයන් හි තහනම් දුර ප්‍රමාණය |  | ආලෝක සංඥාවට ළඟා වන ස්ථානයට මීටර් 50 ක් ඇතුළත වාහනය නතර කර තැබීම තහනම් හෝ සීමා කර ඇත. |
| පදිකයින් විසින් ක්‍රියා කරවනු ලබන මාර්ග සංඥාවලට ඇති තහනම් දුර ප්‍රමාණය |  | ආලෝක සංඥාවට ළඟා වන ස්ථානයට මීටර් 30 ක් ද මීටර් 15 ක් පිටව යන පැත්තට ද ඇතුළත වාහනය නතර කර තැබීම තහනම් හෝ සීමා කර ඇත. |

චතුර රියදුරු පුහුණු පාසල - බෙලිඅත්ත.